# මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල
## மஹபொல உயர்கல்வி புலமைப்பரிசில் நம்பிக்கை நிதியம்
## Mahapola Higher Education Scholarship Trust Fund

# 2018

## වාර්ෂික වාර්තාව හා ගිණුම්
## வருடாந்த அறிக்கையும் கணக்குகளும்
## ANNUAL REPORT & ACCOUNTS

# 2018

# වාර්ෂික වාර්තාව හා ගිණුම්

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව

භාර අරමුදල

## දැක්ම (Vision)

දිළිඳුකම තුරන් කිරීම ඉලක්ක කරගත් වියත් සමාජයක් බිහිකිරීම.

## ඉලක්ක (Mission)

වරප්‍රසාද නොලත් යෞවනයනට උසස් අධ්‍යාපන කටයුතු සපුරා ගැනීම සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීම සහ උසස් අධ්‍යාපනය වෙනුවෙන් පහසුකම් නංවාලීම මඟින් සම අවස්ථා ඇති කිරීම.

## මෙහෙවර (Objectives)

- යෞවනයන්ට උසස් අධ්‍යාපන පහසුකම් සැලසීම.
- ද්විතියන අධ්‍යාපනය සතුටුදායක ලෙස සම්පූර්ණ කර සිටින ආධාර ලැබීමට සුදුසු යෞවනයන්ට උසස් අධ්‍යාපන ආයතනයකදී සිය අධ්‍යාපනික, කාර්මික හෝ තාක්ෂණික අධ්‍යාපන කටයුතු සපුරා ගැනීම සඳහා උපකාර වන ආධාර සැපයීම.
- තරුණයින්ගේ හැකියා දියුණු කිරීම සඳහා වෘත්තීය අභ්‍යාස ආයතන පිහිටුවීම හා ඒවායෙහි කළමනාකරණයට සහායවීම.
- අධ්‍යාපන කටයුතු වැඩිදියුණු කිරීමෙහි නිරතවන පාසල් සහ ආයතන ආදිය පිහිටුවීම හා ඒවාට ආධාර සැලසීම.
- අධ්‍යාපන කටයුතු වැඩිදියුණු කිරීමෙහි නිරතවන පුද්ගලයින්ගේ නිපුණතා නංවාලීම සහ වර්ධනය කිරීම සඳහා ආධාර සැපයීම. (දැනට ප්‍රධාන වශයෙන් උසස් අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්ව ලබාදීම මූලික හා ප්‍රමුඛ කාර්යය ලෙස සලකා ක්‍රියා කර ඇත.)



## මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ අධ්‍යක්ෂවරයාගේ වාර්තාව

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ අධ්‍යක්ෂවරයා වශයෙන් 2015 වසරේ පත් වූ අතර මහපොළ ශිෂ්‍යත්වලාභියෙක් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ අධ්‍යක්ෂවරයා වශයෙන් පත් වූ පළමු අවස්ථාව මෙය වේ. 1984 - 1985 අධ්‍යයන වසරේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන විශේෂ උපාධිය ලබාගැනීමට සමත් විය. ඉන් අනතුරුව වර්ෂ 04 ක කාලයක් ගණකාධිකරණ ක්ෂේත්‍රයේ පුහුණුව ලබා 1996 වර්ෂයේ දී පෞද්ගලික ආයතනයක ගණකාධිකාරවරයෙකු වශයෙන් රැකියාව ආරම්භ කළේය. එම ආයතනය පූර්ණ විදේශීය ආයෝජනයක් වූ අතර, කර්මාන්තශාලා 03 ක් ආරම්භකොට ලංකාවේ අපනයන ක්ෂේත්‍රයේ ඉහළ ආයතනයක් බවට පත්විය. එම ආයතනයේ විවිධ තනතුරු දරමින් අවසාන වශයෙන් එහි අධ්‍යක්ෂවරයෙකු වශයෙන් පත්විය. ඉන් අනතුරුව 2012 වර්ෂයේදි විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ගණකාධිකාරවරයෙකු වශයෙන් සේවයට බැඳුනු අතර, එහි වසර 05 ක සාර්ථක සේවා කාලයක් නිමකළ අතර, ඒ තුළින් විශ්ව විද්‍යාල පද්ධතිය පිළිබඳව හා එහි ක්‍රියාකාරීත්වය පිළිබඳව මනා අවබෝධයක් ලබාගන්නා ලදී. එහි දී විශේෂයෙන්ම මහපොළ හා ශිෂ්‍යාධාර ගෙවීම් සම්බන්ධයෙන් කටයුතු පැවරී තිබූ අතර, මහපොළ සම්බන්ධයෙන් විශේෂ පළපුරුද්දක් හා අත්දැකීමක් ලබාගන්නා ලදී. එම ලබාගන්නා ලද පළපුරුද්ද හා අත්දැකීම් මත මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ අධ්‍යක්ෂවරයා වශයෙන් කටයුතු කිරීමට එවකට පැවති භාරකාර මණ්ඩලය මාව තෝරා ගන්නා ලදි.

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල රටේ උසස් අධ්‍යාපනය හදාරන සිසුන්ගේ දායාදයක් වන අතර, එහි නිර්මාර්තෘ ගරු දිවංගත ලලිත් ඇතුලත්මුදලි ශ්‍රීමතානන් මෙම අවස්ථාවේ දී ඉතා කෘතඥවේදීව සිහිපත් කරන අතර, ඒ උදාර මිනිසා දූරදක්නා නුවණින් හා ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය කෙරෙහි යෞවනයන්ගේ දායකත්වය ඉතා වටිනා සම්පතක් බව අවබෝධකරගෙන අඩු පහසුකම් සහිත යෞවනයන්ගේ උසස් අධ්‍යාපන අවස්ථා උදාකර ගැනීම සඳහා අවශ්‍ය මූලාධාර සැපයීම පෙරදැරි කරගෙන තම පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් ආරම්භ කළ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල 2018 වන විට වසර 39 ක් ගතවී ඇති අතර, රු.බි. 15 කට අධික වියදමක් දරා ලක්ෂ 3 කට අධික සිසුන් සංඛ්‍යාවකට මහපොළ ශිෂ්‍යත්ව ලබා දී ඇති අතර, වර්තමානයේ අරමුදල රු.බි. 10 කට අධික වත්කම් වලින් ශක්තිමත් වී ඇත.

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය 1999 වර්ෂයේදී මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල යටතේ ආරම්භ කරන ලද අතර ශ්‍රී ලංකාවට අවශ්‍ය තොරතුරු තාක්ෂණිකයන් හා විද්‍යාඥයින් බිහිකරන ප්‍රධාන ආයතනයක් බවට පත් වී ඇත. අද වන විට ආයතනයේ වත්කම් වල වටිනාකම රු.බි. 10 කට අධික වන අතර මෙම ආයතනය තොරතුරු තාක්ෂණය පිළිබඳව රජයේ පිළිගත් විශ්ව විද්‍යාලයක් බවට

පත්කිරීමට අවශ්‍ය කෙටුම්පත් සකස්කරමින් පවතී. ඒ අනුව 21 වන සියවසේ අධ්‍යාපනය කේන්ද්‍රීය කරගත් ආර්ථික ක්‍රමයක් කෙරෙහි ගමන් කිරීමේදී මානව සම්පත පුහුණු කිරීම උදෙසා මෙය ඉතා විශාල පිටුවහලක් වනු ඇත. වාර්ෂිකව සිසුන් 10,000 ක පමණ විවිධ පාඨමාලා සඳහා බඳවා ගැනීමට අවශ්‍ය යටිතල පහසුකම් මෙම ආයතනය සතුව පවතී.

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල් පනතේ අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කරගැනීම උදෙසා ප්‍රාථමික හා ද්විතීක අධ්‍යාපනය ඉහළ නැංවීම අරමුණු කොට ගෙන දිවයිනේ පාසැල් පද්ධතිය වැඩි දියුණු කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධන කිරීම හා දුෂ්කර ග්‍රාමීය පාසල් නඟා සිටුවීම සඳහා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පසුගිය දශකය තුල ඉතා විශාල කාර්ය භාර්යක් ඉටු කර ඇති බව ඉතා සතුටින් ප්‍රකාශ කරනු කැමැත්තෙමි. ඒ අනුව විද්‍යාල ශ්‍රවණාගාර, ක්‍රීඩාගාර හා පිහිනුම් තටාක පාසල් ගොඩනැගිලි විශාල ප්‍රමාණයක් ඉදිකිරීම සඳහා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල මගින් ප්‍රතිපාදන ලබා දී ඇත. මෙම අරමුණ යටතේ පාසල් පද්ධතිය දියුණු කිරීම තුල අඩු පහසුකම් ඇති ග්‍රාමීය ශිෂ්‍ය ප්‍රජාවට උසස් අධ්‍යාපන වරම් ලබා ගැනිමට එය දැඩි පිටුවහලක් විය.

පසුගිය දශකය තුල විශ්ව විද්‍යාල සඳහා බඳවා ගන්නා ලද සිසුන් සංඛ්‍යාව දිගින් දිගටම ඉහළ නැංවූ අතර එයට සමානුපාතිකව මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල ශිෂ්‍යත්ව ප්‍රමාණය ඉහළ නැංවීමට කටයුතු කරන ලදි. ඒ අනුව 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා විශ්ව විද්‍යාල වලට ඇතුලත් වූ සිසුන් අතරින් 50% වඩා වැඩි ප්‍රතිශතයකට මහපොළ ශිෂ්‍යත්ව ලබා දීමට හැකියාව ලැබුණි. එයට අදාල අරමුදල් සම්පාදනය කර ගැනීමටත් ප්‍රතිපාදන සලසා ගැනිමටත් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට හැකියාව ලැබීම ඉතා සතුටට කරුණකි.

මෙහිදි ශිෂ්‍යත්ව ප්‍රමාණය වැඩිකිරීම සම්බන්ධයෙන් 2018 වර්ෂයේ දී විශේෂ ප්‍රතිපත්තිමය තීරණ කිහිපයක් ක්‍රියාවට නැගුණ අතර, එහිදී සලකා බලන පවුලේ වාර්ෂික ආදායම රු. ලක්ෂ 3 - රු. ලක්ෂ 5 දක්වා ඉහළ නැංවූ අතර, එමගින් රජයේ සේවයේ නියුතු හා ත්‍රිවිධ හමුදාවල නියුතු යම් පිරිසකට ඔවුන්ගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව හිමිවිය. එමගින් අතිරේක සිසුන් 3,000 කට පමණ වාර්ෂිකව ලබාදෙන ශිෂ්‍යත්ව ප්‍රමාණය වැඩිකිරීමට හැකියාව ලැබුණි. මේ සඳහා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල රු.මි.500 යක් පමණ වාර්ෂික අතිරේක පිරිවැයක් දැරීමට සිදුවිය. කෙසේ වෙතත් 2018 වර්ෂයේදී විශ්ව විද්‍යාල වලට සිසුන් 30,000 ක් පමණ ඇතුලත් කරගත් අතර, එයින් සිසුන් 15,000කට පමණ මහපොළ ශිෂ්‍යත්ව ලබාදීමට හැකියාවක් ලැබුණි. මෙය ඉදිරි වර්ෂ 5 තුලදී සිසුන් 25,000 දක්වා ඉහළ නැංවීමට බලාපොරොත්තු වන අතර, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදනය සඳහා වන සැලසුම් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ ඉදිරි වර්ෂ 05 සඳහා වන උපාය මාර්ගික සැලසුම් වලට ඇතුලත් කොට ඇත.

පසුගිය දශකයක කාලය තුල මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල විවිධ අර්බුදවලට හා දුර්වල කළමනාකරණය නිසා ඉතා විශාල පසුබෑමකට ලක් වූ අතර දූෂණ හා අක්‍රමිකතා නිසා අරමුදලේ වර්ධනය ඉතා විශාල ලෙස පහළගොස් තිබුණි. 2015 වර්ෂයේ මාගේ පත්වීමත් සමඟ එම සියලු දූෂණ හා අක්‍රමිකතා පිළිබඳව ඉතා සූක්ෂමකව විමර්ශණය කොට ඒවා වැලැක්වීම සඳහා අවශ්‍ය පියවර භාරකාර මණ්ඩලයේ අනුමැතිය යටතේ ගැනීමට හැකි වූ අතර ඒ සඳහා විශාල කැපකිරීමක් සිදුකල අතර, ඒ තුළින් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල සුරක්ෂිත කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙලවල් රාශියක් දියත් කිරීමට හැකියාවක් ලැබුණි.

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල යටතේ පිහිටුවා තිබූ සමාගම් 02 ක් නෙට්වෙල්ත් කෝප්පරේෂන් සමාගම හා නෙට්වෙල්ත් සිකියුරිටි සමාගම් වල දුර්වල කළමනාකරණය හේතුවෙන් පසුගිය වර්ෂ 05 තුළ ඉතා විශාල අලාභයක් ලබා තිබූ අතර, එම ආයතන වල කටයුතු හා කළමනාකරණය ප්‍රතිව්‍යුහගත කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබාගත් අතර, එයට අදාල කටයුතු දැනට සිදුවෙමින් පවතී.

ප්‍රධාන අරමුදල කළමනාකරණය කිරීමට එම සමාගම් වලට පවරා තිබූ අතර. එයින් ඉවත් කොට 2018 වර්ෂයේදී මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල යටතට පත්කිරීම තුළින් 2019 පළමු අර්ධ වර්ෂය තුල අරමුදලේ ආදායම් වර්ධන වේගය 35% කින් ඉහළ නැංවීමට හැකියාව ලැබුණි. තවද ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය හා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල අතර භාරකාර අරමුදලට හිමි වත්කම් බැහැර කිරීම සම්බන්ධයෙන් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට අවාසි දායක ගිවිසුම් 02කට එළඹි තිබූ අතර, එය නිවැරදි කිරීමට හා අරමුදල් සතු වත්කම් සුරක්ෂිත කිරීමට අදාල ඉතා විශාල කාර්යභාරයක් 2018 වර්ෂය තුල ඉටුකිරීමට හැකියාව ලැබුණි. ඒ අනුව මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට අවාසිදායක ගිවිසුම් අහෝසි කිරීමට හා එම වත්කම් නැවත මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට ලබා ගැනීමට අදාල ඉල්ලීම් ජනාධිපති විමර්ෂණ කොමිසම් සභාව හා අල්ලස් හෝ දූෂණ විමර්ෂණ කොමිසම් සභාව වෙත යොමුකොට එම ගිවිසුම් අවලංගු කිරීමට අවශ්‍ය පසුබිම සකස්කොට ඇත.

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල් පනත 1981 පාර්ලිමේන්තුවේ සම්මත කළ අතර, අද වන විට වසර 39 ක් ගෙවී ඇති නමුත් අරමුදලේ මූල්‍ය ක්‍රියාකාරීත්වය ආරක්ෂා කිරීමට හා අරමුදල පරිපාලනය සඳහා පත්කරන ලද නිලධාරීන් හා භාරකරුවන් අතින් සිදුවන වැරදි හා අවභාවිතයන් නිසා අරමුදලට සිදුවන අලාභ අවම කරගැනීම සඳහා භාර අරමුදලේ සියලුම සේවකයින් හා භාරකරුවන් පොදු දේපල පනතේ වැරදි සම්බන්ධ වන විධි විධාන වලට යටත් කිරීමට අදාල සංශෝධන ඇතුලත් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල් පනතට ඇතුලත් කොට 2018 වසරේ දී මහපොළ පනත සංශෝධනය කරන ලදී.

ඒ අනුව ඉදිරියේදී මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල සතු වත්කම් ඉතා සුරක්ෂිතව ඉදිරියට පවතින අතර, රටේ අනාගත උසස් අධ්‍යාපනය හදාරන සිසු දරුවන්ට වඩා පුළුල් ඉඩ ප්‍රස්ථා ඇති කිරීමට එය පිටුවහලක් වනු ඇත.

වර්තමානයේ මිල මට්ටම් වල ඉහල යාම සහ උසස් අ අධ්‍යාපනය හදාරන සිසුන්ගේ එදිනෙදා අවශ්‍යතා සපුරා ගැනීමට ඉතා විශාල වියදමක් දැරීමට සිදුවී බැවින්, නියමිත නිශ්චිත දිනයකදී ඔවුන්ගේ ශිෂ්‍යත්ව වාරික ලබා දීමට අවශ්‍ය කටයුතු සිදුකොට ඇත. මේ යටතේ පෙර පැවති ගෙවීම් ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම ප්‍රතිව්‍යුහගත කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර, ඒ සඳහා මහා භාණ්ඩාගාර අනුමැතිය ද ලැබුණි. එතෙක් පැවති ගෙවීම් ක්‍රමය යටතේ සිසුන්ට මාසිකව ශිෂ්‍යත්ව වාරික විශ්ව විද්‍යාල මගින් ගෙවූ අතර, මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ දායකත්වය විශ්ව විද්‍යාලට යොමු කරන ලදී. මෙම ගෙවීම් ක්‍රියාවලිය සඳහා ඉතා විශාල කාලයක් ගත වූ අතර, සිසුන් මාස 02 ක් හෝ ඊට වැඩි කාලයක් ශිෂ්‍යත්ව වාරික ගෙවීමට ප්‍රමාද විය. ඒ අනුව මෙම ගෙවීම් ක්‍රමය සම්පූර්ණයෙන් වෙනස් කොට මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල මගින් මාසිකව ශිෂ්‍යත්ව වාරිකය සෑම මාසයකම 15 වන දින සිසුන්ගේ බැංකු ගිණුම් වෙත සෘජුවම බැර කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇති අතර, ගෙවීම් වලට අදාල නිර්දේශ පමණක් විශ්ව විද්‍යාලයෙන් ලබා ගන්නා ලදී. ඒ අනුව සියළුම විශ්ව විද්‍යාල හා විද්‍යායතන වල සිසුන් 60,000 කට පමණ 2019 වර්ෂයේ සිට මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල මගින් සෘජුවම ගෙවීම් කටයුතු සිදුකරනු ලබයි. මෙම ක්‍රමය දැනට සාර්ථකව ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබී ඇති බැවින් එය සතුටට කරුණක් බව ප්‍රකාශ කරන අතර, ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබාදුන් සියළු දෙනාටම මාගේ ප්‍රණාමය පුද කරමි.

පසුගිය වකවානුවේ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ භාරකාර මණ්ඩල රැස්වීම්, විගණන කමිටු රැස්වීම් විධිමත්ව පැවැත් වූ අතර. 2015 සිට මේ දක්වා සෑම මාස 02 කට වරක්ම භාරකාර මණ්ඩල රැස්වීම් පැවැත් වූ අතර, 2018 වර්ෂයේ දී භාරකාර මණ්ඩල රැස්වීම් 06 ක් සහ විගණන හා කළමනාකරන කමිටු රැස්වීම් 04 ක් පවත්වා ඇත. ඒ අනුව එමගින් ගන්නා ලද තීන්දු තීරණ ඉතා සාර්ථකව ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබුණු අතර, ඒ තුළින් ආයතනයේ යහපාලනය ශක්තිමත් කිරීමට හැකියාව ලැබී ඇති බව ප්‍රකාශ කරමි.

2018 වර්ෂයේ දී මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ කාර්යන් හා කර්තවයන් කාර්යක්ෂම කිරීම සඳහා හා ශිෂ්‍යත්ව ලාභියන්ගේ අවශ්‍යතා සපුරාලීම පහසු කිරීම අරමුණු කොට ගෙන ගෙවීම් පද්ධතිය හා ගිණුම් පද්ධතිය පරිගණකගත කිරීමට අදාල සියළු කටයුතු සූදානම් කල අතර, ගෙවීම් පද්ධතිය 90% ක් පමණ අවසන් කිරීමට හැකියාව ලැබුණි. එසේම නව පරිගණක ගත ගිණුම් ක්‍රමයක් හඳුන්වා දුන් අතර, එය 2019 වර්ෂයේ සිට ඉතා සාර්ථකව ක්‍රියා කරන ලදී.

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල සතුව වෙබ් අඩවියක අවශ්‍යතාවය ඉතා දීර්ඝකාලයක සිට පැවති අතර, 2018 වර්ෂයේ දී එම මහපොළ වෙබ් අඩවිය නිර්මාණය කොට අවසන් කිරීමට ද හැකියාව ලැබුණි. ඒ අනුව 2019 අවසන් වීමට ප්‍රථම එය දියත් කිරීමට හැකියාව ඇති බව ඉතා සතුටින් ප්‍රකාශ කරමි. එසේම ආයතන යහපාලනය හා සිසුන්ගේ හා අනෙකුත් උනන්දුවක් දක්වන සියළුදෙනාගේම තොරතුරු අවශ්‍යතාවය සපුරාලීමට ඉන් හැකියාවක් ලැබෙනු ඇත.

2020-2025 මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ උපාය මාර්ගික සැලැස්ම සකස්කොට ඇති අතර, එමගින් උසස් අධ්‍යාපනය හදාරන සිසුන්ගේ උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම උදෙසා විශාල වැඩ පිළිවෙලක් ඉදිරිපත් කොට ඇති අතර, දැනට අරමුදලේ පවතින වත්කම් දෙගුණයක් බවට පත්කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කොට ඇත.

අවසාන වශයෙන් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල ශක්තිමත් කිරීමට හා එහි යහපාලනය හා ක්‍රියාකාරීත්වය ශක්තිමත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේදී සහයෝගය දැක්වූ, 2015 සිට මේ දක්වා පත් වූ සියලුම භාරකරුවන්ටත්, නිලධාරීන්ටත්, කැපවීමෙන් වැඩ කරන සේවක මණ්ඩලයටත්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ හා අනෙකුත් ආයතනයන්හි සියලුම නිලධාරීන්ට හා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ ගෙවීම් ක්‍රියාවලිය ප්‍රතිව්‍යුහගත කිරීමට දායක වූ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපතිවරයා ඇතුළු කාර්ය මණ්ඩලයට හා සියලුම විශ්ව විද්‍යාලවල උපකුලපතිවරුන් හා නිලධාරීන්ට මාගේ කෘතඥතාවය පළකර සිටිමි.

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල ඉදිරි වර්ෂ 10 තුල දී මේ රටේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ අවස්ථා පුළුල් කිරීමට හා ශක්තිමත් කිරීමට අවශ්‍ය මූල්‍ය ශක්තිය ලබාදීමට හැකිවන ඉතා විශිෂ්ඨ ආයතනයක් බවට පත්වේවා යැයි මම ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

එම්.පරාක්‍රම බණ්ඩාර
අධ්‍යක්ෂ
මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

# පටුන


| | පිටුව |
|---|---|
| **අප ගැන** | |
| මූලික වටිනාකම් | 1 |
| ඉතිහාසය දෙස හැරී බැලීමක් | 2 |
| අපගේ ගමන් මඟ/ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථාන | 3 |
| භාරකාර මණ්ඩලය - (1981 – 2018) | 4 - 5 |
| **කළමනාකරණ සාකච්ඡාව හා විශ්ලේෂණය** | |
| මෙහෙයුම් සමාලෝචනය | 6-16 |
| ආයතනික යහපාලනය | 17-19 |
| ආයතනික ව්‍යුහය | 20-21 |
| **මූල්‍ය වාර්තා** | |
| විගණකාධිපති ජනරාල්ගේ වාර්තාව | 22 - 29 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | 30 - 32 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය | 33 |
| ස්කන්ධ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය | 34 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 35 |
| ගිණුම්කරණ ප්‍රතිපත්ති | 36 - 48 |
| මූල්‍ය ප්‍රකාශනවලට සටහන් | 49 - 53 |

## මූලික වටිනාකම්

### සුපිලිපන්බව (Integrity)

අප විසින් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව සඳහා තෝරා ගන්නා ලද සිසුන් නියමිත ක්‍රමවේදයක් යටතේ ඉතා විනිවිද භාවයකින් යුක්තව සාධාරණව සිදු කරන අතර සුදුසුකම් ලබන සිසුන්ගේ ගෙවීම් ඉතා සාධාරණ කාලයක් තුළ ඔවුන්ට ලබාදීමට නිතරම උත්සුක වේ.

### සුභවාදී ආකල්ප (Positive Attitudes)

ශිෂ්‍යත්ව ලබාදීමේදී හා අනෙකුත් ආයතන සමඟ හා විශ්ව විද්‍යාල සමඟ කටයුතු කිරීමේදී හා අරමුදල් සපයා ගැනීමේදී ඉතා විශාල අභියෝග රාශියකට මුහුණදීමට සිදුවන අතර එම සියලුම අභියෝග ඉතා සුභවාදීව ජය ගැනීමට මනා එළඹුමක් සේවකයන් තුළ පවතී.

### ප්‍රතිඵලදායක බව (Effectiveness)

ස්වකීය කාර්යභාරයන් පිළිබඳව මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ සේවකයින් තුළ මනා අවබෝධයක් හා විශ්වාසනීයත්වයක් පවතින අතර ඔවුන් දෙන ලද ඉලක්ක කාර්යක්ෂමව අත්පත් කර ගැනීමට නිතරම උක්සුක වේ. ඉතා කුඩා සේවක සංඛ්‍යාවක් ( සේවකයන් 10 ක් ) තුළින් මාසිකව ශිෂ්‍යත්ව 70,000 ක් පමණ ගෙවීම් සිදු කරනු ලබයි.

### නම්‍යතාවය (Flexibility)

අරමුදලේ සේවයකයින් හා අධ්‍යක්ෂ අතුලු භාරකාර මණ්ඩලය අරමුදල ශක්තිමත් කිරීම සඳහා නව අදහස් සොයා යමින් තරඟකාරී මූල්‍ය වෙළඳපළ තුල ඉතා සාර්ථකව කටයුතු කරයි.

### කණ්ඩායම් හැඟීම (Team Spirit)

මහපොළ ශිෂ්‍යත්ව අරමුදලේ සේවකයින් විවෘතභාවය, එකිනෙකා කෙරෙහි දක්වන ලෙන්ගතු බව සහ පුද්ගල සංවර්ධනය ඔස්සේ ආයතනික ඉලක්ක සපුරා ගැනීමෙහිලා එක්ව කටයුතු කරති.

### විශිෂ්ඨත්වය කෙරෙහි නැඹුරුව (Tendency towards uniqueness)

මහපොළ ශිෂ්‍යත්ව අරමුදලේ සේවකයින් අඛණ්ඩව සේවා තත්වයන් උපරිම මට්ටම් කරා රැගෙන ඒම සඳහා කැපවීමෙන් ක්‍රියා කරති.

## මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ ඉතිහාසය දෙස හැරී බැලීමක්

දිවංගත ගරු ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා විසින් 1980 වසරේ දී ගරු වෙළඳ හා නාවික ඇමතිවරයා ලෙස "මහපොළ" සංකල්පය යටතේ පළමුවෙන්ම වෙළඳ සල්පිලක් මගින් ග්‍රාමීය ප්‍රජාව වෙත විවෘත ආර්ථිකයේ ප්‍රතිලාභ හා දැනුම අත්පත් කරදීමේ අභිප්‍රාය ඇතිව එවකට පැවති වෙළඳ හා නාවික කටයුතු අමාත්‍යාංශය "මහපොළ" සංවර්ධනය කරන ලදී. පාසැල් තුල පැවැත් වූ වෙළඳ සල්පිල් හා අධ්‍යාපනික ප්‍රදර්ශන වලදී දොරටු ප්‍රවේශ පත්‍ර හා අලෙවි කුටි අලෙවිය සහ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ලොතරැයිය මගින් ලද ආදායම සහ පරිත්‍යාග එම පාසැල් වල යටිතල පහසුකම් නැංවීම පිණිස සහ මහපොළ ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා ආරම්භයේදී යොදා ගන්නා ලදී. වාණිජ ආර්ථිකයේ මූලිකම වෙනස නාගරික ජනතාවට තරම් ඉක්මනින් ගම්බද ජනතාවට ලැබුනේ නැත. නව වෙළඳ ක්‍රමය තුලින් නාගරික ජනතාව විඳි බොහෝ වරප්‍රසාද ගම්බද ජනතාවට නොලැබුණි. මෙම ගම්බද ,නගරබද පරතරය නැති කොට ගම්බද ජනතාවට දැනුම හා අත්දැකීම් ලබාදීමේ අරමුණින් එවකට සිටි ගරු වෙළඳ හා නාවික ඇමති ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා විසින් තබන ලද එක් පියවරකි "මහපොළ" අද පොදු ජනතාවගේ දායාදයකි. උසස් අධ්‍යාපනයක් ලැබීමේ සහජ හැකියාව ඇති, නමුත් ආර්ථික ප්‍රශ්න වලට මුහුනපා සිටින ජාතියේ උතුම්ම දායාදය වන අනාගත පරපුරට අතදීමකි.

1981 නොවැම්බර් 14 දින ප්‍රථම ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවය ශිෂ්‍යත්ව 422 පිරිනමමින් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විනි. ආරම්භයේ සිට 2018 වන විට ශිෂ්‍යත්ව 300,000 කට අධික ප්‍රමාණයක් පිරිනමා ඇති අතර ඒ සඳහා රු.බි 15 පමණ වැය කොට ඇත. අද වන විට මෙම කර්තව්‍ය සඳහා රුපියල් මිලියන 1600 ක මුදලක් වාර්ෂිකව ශිෂ්‍යත්ව වරික මුදල් ගෙවීම සඳහා අවශ්‍ය වේ.

විශ්ව විද්‍යාලවලට ඇතුලත්වීමට නොහැකි වූ සිසුන්ට තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය සඳහා, 1999 වර්ෂයේදී කඩුවෙල මාලබේ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT) තොරතුරු තාක්ෂණ අධ්‍යයන කටයුතු සඳහා ආරම්භ කරන ලදී. ඒ සඳහා මහපොළ අරමුදලින් රුපියල් මිලියන 373ක මුදල්ද, අක්කර 25ක ඉඩමද ලබාදී ඇත. එම ආයතනය තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා සහ උපාධි පාඨමාලා පවත්වනු ලැබේ. දැනට වාර්ෂිකව සිසුන් 10,000ක් පමණ බඳවා ගනු ලැබේ.

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ මුදල් අයෝජන කටයුතු සම්බන්ධයෙන් නැෂනල් වෙල්ත් කොපරේෂන් සමාගම හා එහි උප සමාගමක් ලෙස නැෂනල් වෙල්ත් සිකියුරිටි සමාගම 2003 වර්ෂයේදි ආරම්භ කරන ලදී. ආරම්භයේදි ලබාදුන් රු.බි 3.16ක මුදල 2018 වර්ෂයේදි අරමුදල රු.බි 8.5 දක්වා වර්ධනය කර ඇත.

## මහපොළ ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථාන

- 1985 වර්ෂයේදී විදේශීය විශ්ව විද්‍යාලයන්හි පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව ප්‍රදානය කර ඒ සඳහා රු.මි 53.8 වැය කර ඇත.

- 1986 වර්ෂයේදී අධ්‍යාපන උපදේශක සේවයට හා ජාතික ඉංග්‍රීසි අධ්‍යාපනය සඳහා ආධාර කිරීම. ඒ සඳහා රු .මි 1 වැය කර ඇත.

- 2003 වර්ෂයේදී මහපොළ ව්‍යපෘති අංශය ආරම්භ කිරිම. මහපොළ සිසු රක්ෂණය හා දහම් පාසැල් ගුරු රක්ෂණය රු.මි 15.4 වැය කර ආරම්භ කිරිම.

- 2004 වර්ෂයේදී මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල යටතේ පිහිටුවා තිබූ පාසැල් සංවර්ධන අරමුදලෙහි පොලී ආදායම් මගින් පාසැල් 11ක සංවර්ධන කටයුතු සඳහා (පාසැල් ගොඩනැගිලි, පිහිනුම් තටාක, ක්‍රීඩා පිට්ටනි, ශ්‍රවනාගාර ඉදි කිරිමට) රු මි 202 වැය කර ආධාර කිරිමට හැකි වූ අතර හෝමාගම පිටිපන මහින්ද රාජපක්ෂ ජාතික පාසැල පිහිටුවීම සඳහා රු.මි.30ක මූලික ආරම්භක වියදම්ද දරන ලදි.

- 2005 වර්ෂයේදී සුනාමියෙන් මියගිය මහපොළ ශිෂ්‍යත්වලාභින්ගේ පවුල්වලට රු මි 1.5 ආධාර මුදල් බෙදාදීම.

- 2015 වර්ෂයේදී මහපොළ ශිෂ්‍යත්ව වාරිකය රු.2,500/= සිට රු.5,000/= දක්වා වැඩි කිරීම.

- 2018 වර්ෂයේදී මහපොළ ශිෂ්‍යත්ව සඳහා සුදුසුකම් ලබන ආදායම් සීමාව රුපියල් ලක්ෂ 300,000/= සිට රුපියල් ලක්ෂ 500,000/= දක්වා වැඩි කිරිම. ඒ තුලින් සිසුන් 3000 කට පමණ ශිෂ්‍යත්ව වැඩි කර ඇත.

**1981 සිට 2018 දක්වා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල භාර අමාත්‍යාංශය හා විෂය භාර අමාත්‍යවරයා**

| | විෂය භාර අමාත්‍යාංශය | විෂය භාර අමාත්‍යවරයා | කාලය (වර්ෂය) |
|---|---|---|---|
| 1 | වෙළඳ හා නාවික අමාත්‍යාංශය | ගරු ලලිත් ඇතුලත්මුදලි අමාත්‍යතුමා | 1981 - 1983 |
| 2 | වෙළඳ හා නාවික අමාත්‍යාංශය | ගරු ලලිත් ඇතුලත්මුදලි අමාත්‍යතුමා (ජාතික ආරක්ෂක අමාත්‍ය) | 1984 - 1988 |
| 3 | වෙළඳ හා නාවික අමාත්‍යාංශය | ගරු ලලිත් ඇතුලත්මුදලි අමාත්‍යතුමා (කෘෂිකර්ම,ආහාර හා සමුපකාර අමාත්‍ය) | 1989-1990 |
| 4 | වෙළඳ හා වාණිජ අමාත්‍යාංශය | ගරු ඒ.ආර් මන්සූර් අමාත්‍යතුමා - භාරකරු, ගරු ලලිත් ඇතුලත්මුදලි අමාත්‍යතුමා (කෘෂිකර්ම,ආහාර හා සමුපකාර අමාත්‍ය) | 1991 -1992 |
| 5 | වෙළඳ හා වාණිජ අමාත්‍යාංශය | ගරු ඒ.ආර් මන්සූර් අමාත්‍යතුමා - භාරකරු, ගරු ලලිත් ඇතුලත්මුදලි අමාත්‍යතුමා (කෘෂිකර්ම,ආහාර හා සමුපකාර අමාත්‍ය) | 1993 |
| 6 | වෙළඳ හා වාණිජ අමාත්‍යාංශය | ගරු ඒ.ආර් මන්සූර් අමාත්‍යතුමා | 1994 |
| 7 | අභ්‍යන්තර හා අන්තර් ජාතික වෙළඳ හා වාණිජ අමාත්‍යාංශය | ගරු කිංස්ලි ටී වික්‍රමරත්න අමාත්‍යතුමා | 1995 - 2000 |
| 8 | අභ්‍යන්තර හා අන්තර් ජාතික වෙළඳ හා වාණිජ, නාවික සංවර්ධන හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය | ගරු රාවුෆ් හකීම් අමාත්‍යතුමා | 2001 |
| 9 | වාණිජ හා පාරිභෝගික කටයුතු අමාත්‍යාංශය | ගරු රවි කරුණානායක අමාත්‍යතුමා | 2002 - 2004 |
| 10 | වාණිජ හා පාරිභෝගික කටයුතු අමාත්‍යාංශය | ගරු ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ අමාත්‍යතුමා | 2004 මැයි - 2007 |
| 11 | වෙළඳ, අලෙවි සංවර්ධන සමුපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යාංශය | ගරු බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමා | 2008 - 2009 |
| 12 | සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය | ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු අමාත්‍යතුමා | 2010 - 2012 |
| 13 | ජනාධිපති ලේකම් කාර්යාලය | ජනාධිපති ලේකම් | 2013 - 2014 |
| 14 | ආහාර සුරක්ෂිතා අමාත්‍යාංශය | ගරු ගාමිනී ජයවික්‍රම පෙරේරා අමාත්‍යතුමා | 2015 |
| 15 | සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය | ගරු මලික් සමරවික්‍රම අමාත්‍යතුමා | 2015 නොවැ. - 2018 |
| 16 | උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | ගරු ආචාර්ය විජයදාස රාජපක්ෂ අමාත්‍යතුමා | 2018 ජූලි |

## භාරකාර මණ්ඩලය - 2018

| | භාරකරු/භාරකරුවන් | තනතුර | සිට | දක්වා |
|---|---|---|---|---|
| 1. | ගරු ප්‍රියසාද් ඩෙප් මහතා | අග්‍රවිනිශ්චයකාරතුමා | 2017 ජූනි | 2018 සැප්. |
| 2. | ගරු මලික් සමරවික්‍රම මහතා | සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය | 2015 ඔක්. | 2018 මාර්තු |
| 3. | ආචාර්ය විජේදාස රාජපක්ෂ මහතා | උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය | 2018 අප්‍රේ. | 2018 සැප්. |
| 4. | චාන්දනී විජේවර්ධන මහත්මිය | ලේකම්, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය | 2015 ඔක්. | 2018 මාර්තු |
| 5. | ජේ.ජේ.රත්නසිරි මහතා | ලේකම්,උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 2018 අප්‍රේ. | 2018 සැප්. |
| 6. | ඩී.ඩී.දිසානායක මහතා | ලේකම්, උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය | 2016 අප්‍රේ. | 2018 මාර්තු |
| 7. | එස්.එස්.හෙට්ටිආරච්චි මහතා | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය | 2017 නොවැ. | 2018 සැප්. |
| 8. | එස්.වී.ඩී.කේසරලාල් ගුණසේකර | පත්කල භාරකරු | 2018 ජූලි | 2019 |
| 9. | ආචාර්ය වික්‍රම වීරසූරිය මහතා | පත්කල භාරකරු | 2015 මාර්තු | 2018 මාර්තු |
| 10. | නීතිඥ අනිල් රාජකරුණා | පත්කල භාරකරු | 2015 මාර්තු | 2018 මාර්තු |
| 11. | වෛද්‍ය ඩී.කේ.ඩී.මැතිවු මහතා | පත්කල භාරකරු | 2018 මැයි | 2018 සැප්. |

## 01. ශිෂ්‍යත්ව ප්‍රදානය

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යාධාර සඳහා අයදුම් කරන පිරිස් අතර වාර්ෂිකව ප්‍රදානය කරන සීමිත මහපොළ ශිෂ්‍යාධාර කුසලතා ප්‍රමාණය අ.පො.ස.(උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල අනුව ප්‍රදානය කෙරේ. එහිදී ඉහළ ලකුණු ලබාගත් සිසුනට කුසලතාව පදනම් කරගෙන මහපොළ කුසලතා ශිෂ්‍යත්වද එතැන් සිට කුසලතාවයට ප්‍රමුඛත්වය දෙමින් පවුලේ ආදායම සැලකිල්ලට ගෙන මහපොළ සාමාන්‍ය ශිෂ්‍යත්වද පිරිනමනු ලැබේ. වාර්ෂිකව වෙන් කරන මුළු මහපොළ ශිෂ්‍යත්ව සංඛ්‍යාවෙන් 10% කුසලතා ශිෂ්‍යාධාර වන අතර ඉතිරි 90% සාමාන්‍ය ශිෂ්‍යත්ව සඳහා වෙන්කර ඇත. සාමාන්‍ය ශිෂ්‍යත්වයකට වඩා රු.50/- ක් කුසලතා ශිෂ්‍යත්වයක් සඳහා ගෙවනු ලැබේ.

මෙම වර්ෂයේදී 2017/18 අධ්‍යන වර්ෂය සඳහා 2017 අ.පො.ස.(උසස් පෙළ) ප්‍රතිපල මත විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මඟින් විශ්ව විද්‍යාල අධ්‍යාපනය පිණිස වර්ෂය තුල ඇතුලත් කල සිසුන් වෙනුවෙන් ශිෂ්‍යත්ව 14,986 ක් ප්‍රදානය කිරීමට මහපොළ ශිෂ්‍යත්ව භාරකාර මණ්ඩලය මඟින් අනුමැතිය ලබාදෙන ලදී. මෙකී සංඛ්‍යාවෙන් 1498 ක් පමණ දෙනෙකු කුසලතා පදනම මත ශිෂ්‍යත්ව ලැබූ අතර ඉතිරි ශිෂ්‍යත්ව 13,490 කුසලතා පදනම මත අඩු අදායම් ලබන පවුල්වල සිසුන් වෙත පිරිනමනු ලැබේ. විශ්ව විද්‍යාලවලට ප්‍රවේශිත මුළු සිසුන් සංඛ්‍යාව වන 28,000 සමඟ සංසන්දනය කිරීමේදී සිසුන්ගෙන් 53% ක් මෙම මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානය යටතේ ආවරණය විය. මේ අනුව 2018 වර්ෂයේදි විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මඟින් නිර්දේශිත පාඨමාලා සඳහා ඇතුලත් කල ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් ශිෂ්‍යාධාර ලබා දෙන ලදි.

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මඟින් නිර්දේශ කරන ලද ශිෂ්‍යත්ව ප්‍රමාණයට අමතර වශයෙන් පහත සඳහන් අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනයන්හි උපාධි හා වෘත්තීය ඩිප්ලෝමා පාඨමාලා සඳහා ශිෂ්‍යත්ව 2051 ක් පිරිනැමීමට ක්‍රියාකර ඇත.

## මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානය 2014 – 2018

| | විශ්වවිද්‍යාලය | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|
| 1. | කොළඹ | 1,387 | 1,246 | 1,182 | 1,521 | 1,761 |
| 2. | පේරාදෙණිය | 1,615 | 1,381 | 1,318 | 1,452 | 1,757 |
| 3. | කැළණිය | 1,371 | 1,590 | 1,551 | 1,820 | 1,985 |
| 4. | ශ්‍රී ජයවර්ධනපුර | 1,810 | 1,859 | 1,894 | 2,029 | 2,288 |
| 5. | මොරටුව | 836 | 836 | 775 | 828 | 957 |
| 6. | යාපනය | 709 | 785 | 1,049 | 1,129 | 1,062 |
| 7. | යාපනය (රාමනාදන්) | 27 | 130 | 116 | 142 | 40 |
| 8. | රුහුණ | 667 | 1,015 | 907 | 1,009 | 1,098 |
| 9. | යාපනය - වවුනියා මණ්ඩපය | 48 | 104 | 124 | 109 | 90 |
| 10. | නැගෙනහිර | 285 | 340 | 583 | 633 | 402 |
| 11. | ගම්පහ වික්‍රමාරච්චි අයුර්වේද විද්‍යායතනය | 34 | 31 | 8 | 7 | 16 |
| 12. | දේශීය වෛද්‍ය විද්‍යායතනය | 79 | 68 | 66 | 73 | 93 |
| 13. | කොළඹ පරිගණක පාසැල | 90 | 69 | 83 | 94 | 131 |
| 14. | කොළඹ - ශ්‍රී පාලි | 32 | 92 | 69 | 99 | 63 |
| 15. | සෞන්දර්ය කලා | 187 | 348 | 330 | 330 | 242 |
| 16. | අග්නිදිග | 500 | 801 | 908 | 905 | 651 |
| 17. | රජරට | 561 | 609 | 673 | 814 | 779 |
| 18. | සබරගමුව | 339 | 546 | 535 | 556 | 540 |
| 19. | වයඹ | 360 | 358 | 509 | 574 | 683 |
| 20. | නැගෙනහිර-ත්‍රිකුණාමලය මණ්ඩපය | 72 | 109 | 127 | 118 | 135 |
| 21. | ඌව වෙල්ලස්ස | 101 | 167 | 229 | 251 | 175 |
| 22. | ස්වාමි විපුලානන්ද | 37 | 191 | 140 | 161 | 38 |
| | **මුළු ශිෂ්‍යත්ව සංඛ්‍යාව** | **11,147** | **12,675** | **13,176** | **14,654** | **14,986** |


මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානයන් (අනෙකුත් ආයතන)

| | ආයතනය | සිසුන් සංඛ්‍යාව |
|---|---|---|
| 1. | ශ්‍රී ලංකා නීති විද්‍යාලය | 25 |
| 2. | ජාතික තාක්ෂණ ආයතනය, මොරටුව | 70 |
| 3. | බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | 26 |
| 4. | බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය | 20 |
| 5. | ජාතික සමාජ සංවර්ධන ආයතනය (උපාධි 10 ඩිප්ලෝමා 14) | 10 |
| 6. | ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය | 1500 |
| 7. | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | 400 |
| | එකතුව | **2051** |

විශ්ව විද්‍යාල ප්‍රවේශිත මුළු ශිෂ්‍යත්ව සංඛ්‍යාව හා මහපොළ ශිෂ්‍යත්වලාභීන් අතර සැසඳීම

| වර්ෂය | **2014** | **2015** | **2016** | **2017** | **2018** |
|---|---|---|---|---|---|
| විශ්වවිද්‍යාලවලට ඇතුලත් වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 22,687 | 25,523 | 28,939 | 30,000 | 31,158 |
| ආදායම් සීමාව අනුව සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව | 13,500 | 14,000 | 15,000 | 15,000 | 20,000 |
| මහපොළ ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව | 12,675 | 13,176 | 14,654 | 14,500 | 14,984 |
| ආදායම් සීමාව අනුව සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව මුළු ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස | 59% | 54% | 52% | 50% | 64% |
| මහාපොළ ලාභීන් මුළු ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස | 56% | 52% | 51% | 48% | 48% |
| ආදායම් සීමාව අනුව සුදුසුකම් ලැබූ සිසුන් අතරින් මහපොළ ලැබූ සිසුන් | 94% | 94% | 97% | 96% | 75% |


**මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානය 2014 – 2018**




**02.** ශිෂ්‍යත්ව ගෙවීම


මහපොළ ශිෂ්‍යත්වලාභියෙකුට එක අධ්‍යයන වර්ෂයකදී මසකට වාරිකය බැගින් ශිෂ්‍යත්ව වාරික 10 ක් ගෙවනු ලැබේ. ඒ අනුව, ශිෂ්‍යත්වය වෙනුවෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම හරහා මහා භාණ්ඩාගාරයෙන් මාසිකව සපයන රු.2,450/- ක් ද ඇතුළුව සෑම මහපොළ ශිෂ්‍යාවත්වලාභියෙකුම පිළිවෙලින් කුසලතා ශිෂ්‍යත්ව සඳහා රු.5,050/- ක් ද සාමාන්‍ය ශිෂ්‍යත්ව සඳහා රු.5,000/- ක් ද විශ්ව විද්‍යාල මඟින් ලබාදෙනු ලැබේ.

**මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ගෙවීම 2014 - 2018**



### ශිෂ්‍යත්ව ගෙවීම් කඩිනම් කිරීම උදෙසා සෘජු ගෙවීම් ක්‍රමය හඳුන්වාදීම


### පැරණි ගෙවීම් ක්‍රමය




විශ්වවිද්‍යාලය විසින් අත්සන් ලේඛණ භාවිතා කරමින් සිසුන්ගේ ගෙවීම් කටයුතු සිදුකරන ලදී. එහිදී ඉතා විශාල ප්‍රමාදයක් සිදුවිය. මාස 03 හෝ 04 ක් ප්‍රමාදවී වාරික සිසුන් වෙත ලබාදීම සිදුවිය.

මෙම ප්‍රමාදය වැලැක්වීම සඳහා ශිෂ්‍යත්ව වාරිකය සිසුන්ගේ බැංකු ගිණුම් වෙත සෘජුවම බැරකරන ක්‍රමයක් යෝජනා කොට මහාභාණ්ඩාගාරයේ එකඟතාවය මත 2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන ලදී.

### නව ගෙවීම් ක්‍රමය




ඒ අනුව දැනට විශ්වවිද්‍යාල හා අනෙකුත් ආයතන 22 සිසුන් 70,000 ක් සඳහා සෘජු බැංකු ගෙවීම් ක්‍රමය යටතේ ශිෂ්‍යත්ව වාරික ගෙවීම සිදු කරයි. ගෙවීම් සඳහා විශ්වවිද්‍යාල සෘජුවම මැදිහත් නොවන අතර මහපොළ අරමුදල විසින් මාසික වාරිකය රු.5,000/- හා රු.5,050/- සිසුන්ගේ ගිණුම්වලට බැර කරනු ලැබේ. මෙය ඉතා සාර්ථකව සිදුවන අතර කිසිදු ප්‍රමාදයකින් තොරව සිසුන්ට වාරික මුදල් නියමිත වේලාවට ලැබේ.

## මහපොළ ශිෂ්‍යත්ව සුදුසුකම් නිර්ණායක

### මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා සුදුසුකම් නිර්ණායක

ලලිත් ඇතුලත්මුදලි ශිෂ්‍යත්ව භාර අරමුදල කුසලතා ශිෂ්‍යත්ව සහ සාමාන්‍ය ශිෂ්‍යත්ව කාණ්ඩ දෙකක් යටතේ ශිෂ්‍යත්ව ප්‍රදානය කෙරේ.

1. **කුසලතා ශිෂ්‍යත්වය**

   අ.පො.ස.උසස් පෙළ විභාගයේදී සිසුන්ගේ කාර්ය සාධනය මත පදනම්ව කුසලතා කාණ්ඩය යටතේ සීමිත මහපොළ ශිෂ්‍යත්ව ප්‍රමාණයක් ප්‍රදානය කෙරේ.විභාගයෙන් ඉහළ ප්‍රතිපල ලබා ගන්නා සිසුන්ට මෙම කාණ්ඩය යටතේ ශිෂ්‍යත්ව ප්‍රදානය කෙරේ. ශිෂ්‍යත්ව වලින් 10% ක් කුසලතා ක්‍රමය යටතේ ලබා දෙනු ලබයි.

2. **සාමාන්‍ය ශිෂ්‍යත්වය**

   මහපොළ සාමාන්‍ය ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු ලබන්නේ ශිෂ්‍යයා ලබා ගන්නා දිස්ත්‍රික් කුසලතාවය ප්‍රමුඛතාවය දී පවුලේ ආදායම ද සැලකිල්ලට ගනිමිනි. මහපොළ ශිෂ්‍යත්වයේ මුළු සංඛ්‍යාවෙන් 90% ක්ම සාමාන්‍ය ශිෂ්‍යත්ව සඳහා වෙන් කර ඇත.

### මහපොළ ශිෂ්‍යත්වය සඳහා සුදුසුකම් නිර්ණායක

පහත සඳහන් අවශ්‍යතා සපුරාලන සිසුන් ශිෂ්‍යත්ව ලැබීමට සුදුසුකම් ලබති.

I. ශිෂ්‍යයා ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

II. ඔහු / ඇය විශ්ව විද්‍යාලයක හෝ විශ්ව විද්‍යාලයකට අනුබද්ධ ආයතනයක පූර්ණ කාලීන පාඨමාලාවක් සඳහා අභ්‍යන්තර ශිෂ්‍යයෙකු ලෙස ලියාපදිංචි කළ යුතුය.

III. දෙමාපියන්ගේ ආදායම්

   a) මාපිය ආදායම 2017/18 සිට ක්‍රියාත්මක වන පරිදි වාර්ෂිකව රු. 500,000/- ට සමාන හෝ අඩු විය යුතුය.

   b) ඉහත ආදායම් සීමාව 2017/18 අධ්‍යයන වර්ෂය සඳහා ලියාපදිංචි වූ සිසුන්ට බලපැවැත්වෙනු ඇත. කෙසේ වෙතත්, මෙම චක්‍රලේඛයේ බලපැවැත්වෙන දිනට කිසිදු මූල්‍ය ආධාරයක් නොලැබෙන සිසුන්ට ඔවුන්ගේ දෙමාපියන්ගේ ආදායම සංශෝධිත සීමාවන් තුළට වැටෙන්නේ නම් මහපොළ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.


IV. මහපොළ සඳහා සිසුන් තෝරා ගැනීමේදී, සිසුන්ගේ දෙමව්පියන් නෛතිකව වෙන්වී ඇති අතර, එය සනාථ කිරීම සඳහා ලේඛණමය සාක්ෂි හෝ එකී වෙන් කිරීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ගයක් නොමැති නම්, ග්‍රාම නිලධාරි සහ අදාළ අංශයේ පොලිස් වාර්තා ලැබීමෙන් පසු ආදායම් සීමාව තීරණය කිරීම සලකා බැලිය යුතුය.

V. ශිෂ්‍යයා සේවයේ යොදවා ඇත්නම්, එම රැකියාවෙන් ලැබෙන ආදායම දෙමාපියන්ගේ ආදායමට එකතු කළ යුතුය.

   ශිෂ්‍යයා රැකියාවක නියුතු නම් හා විවාහක නම්, ශිෂ්‍යයා සහ කලත්‍රයා වෙනම පවුලක් ලෙස සැලකිය යුතු අතර, ඉහත (III) හි දක්වා ඇති නීති රීති අනුව මහපොළ සඳහා ඔහුගේ / ඇයගේ සුදුසුකම් අවතක්සේරු කරනු ලැබේ


## 2018.12.31 දිනට මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදලේ මූල්‍ය තත්වය

### ආයොජන කළඹ




| | Rs. M |
|---|---|
| T/ Bonds | 7,242 |
| T/ Bills | 198 |
| Debenture | 1,284 |
| A/Back | 448 |
| FD | 769 |
| R/Repo | 291 |
| **Total** | **10,232** |

### ආයෝජන ආදායම - 2018




| | Rs. M |
|---|---|
| T/ Bonds | 427.1 |
| T/ Bills | 121.9 |
| Debenture | 160.6 |
| A/Back | 41.6 |
| FD | 117 |
| R/Repo/O.N | 43.8 |
| **Total** | **912** |

### මහපොළ භාරකාර අරමුදෙලෙහි අනෙකුත් ආයෝජන

### සංවර්ධන ලොතරැයි මණ්ඩලය (Development Lotteries Board)

මහපොළ භාර අරමුදලේ රු. මිලියන 2.2 සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ආයෝජනය කොට ඇති අතර ලොතරැයි මණ්ඩලයට මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ සභාපති හෝ ඔහුගේ නියෝජිතයෙක් ඇතුළත් වේ.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් උපයන ආදායම ජනාධිපති අරමුදලට කෙලින්ම මාරු කරනු ලැබේ, ඉන්පසුව ලාභ කොටස ජනාධිපති අරමුදල හරහා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත මාරු කරනු ලැබේ.

**සංවර්ධන ලොතරැයි මණ්ඩල 2014 - 2018 ලාභය හා ජනාධිපති අරමුදල හරහා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත මාරුකරන ලද ලාභ කොටස**

| වර්ෂය | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| | රු.(මි) | රු.(මි) | රු.(මි) | රු.(මි) | රු.(මි) |
| සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ශුද්ධ ලාභය | 2016 | 1678 | 1836 | 507 | 2187 |
| මහපොළ භාරකාර අරමුදල වෙත මාරු කල කොටස | 898 | 736 | 767 | 25* | 804 |

* 2017 දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් ගෙවිය යුතු බදු වගකීම් සඳහා රුපියල් බිලියන 1.7 ක් ගෙවා ඇත. එම නිසා සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි ශුද්ධ ලාභය එම ප්‍රමාණයෙන් අඩු විය. එබැවින් මහපොළ භාරකාර අරමුදල වෙත මාරු කර ඇත්තේ රුපියල් මිලියන 25 ක් පමණි.

### නැට්වෙල්ත් කෝපරේෂන් ලිමිටඩ් (NWCL)

මහපොළ භාරකාර අරමුදලේ පූර්ණ හිමිකාරීත්වය යටතේ පවතින නැට්වෙල්ත් කෝපරේෂන් ලිමිටඩ් (NWCL) හි රුපියල් මිලියන 200 ක් ආයෝජනය කරමින් සීමිත සමාගමක් ලෙස 2003 මාර්තු 23 වන දින සංස්ථාගත කරන ලදී. නැට්වෙල්ත් කෝපරේෂන් ලිමිටඩ් ආයෝජන කළමණාකරුවෙකු ලෙස කටයුතු කරන අතර මහපොළ භාරකාර අරමුදලෙහි ආයෝජන කළඹ කළමනාකරණය කරන්නේ අඩු අවදානමකින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමේ අභිප්‍රායෙනි. කැබිනට් මණ්ඩල අනුමැතියට අනුව 2018 වර්ෂයේදී නැට්වෙල්ත් කෝපරේෂන් සමාගම විසින් පාලනය කරන ලද මහපොළ අරමුදල ලංකා බැංකුවේ ආයතනික ශාඛාවේ ඇති මහපොළ ප්‍රධාන ගිණුමට මාරුකරන ලද අතර 2019 පෙබරවාරි 28 වන දින සිට නැට්වෙල්ත් කෝපරේෂන් සමාගම සමඟ තිබූ අරමුදල් කළමනාකරණ ගිවිසුම අවලංගු කරන ලදී.

## නැෂනල් වෙලත් සිකියුරිටීස් සමාගම (NWSL)

නැෂනල් වෙලත් සිකියුරිටීස් ලිමිටඩ් සමාගම 2003 ජුනි 23 වන දින සීමිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.මෙම සමාගම විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභා ආඥා පනත යටතේ මෙන්ම දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත යටතේ හා ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමනයන්ට අනුව ප්‍රාථමික ගැණුම්කරුවෙකු ලෙස කටයුතු කිරීම සඳහා ලියාපදිංචි කොට ඇත.

නැව්වෙල්ත් කෝපරේෂන් සමාගම විසින් 2004 දී තමන්ගේම අරමුදල් ආයෝජනය කරමින් නැෂනල් වෙලත් සිකියුරිටීස් සමාගම ආරම්භ කර ඇති අතර මෙම සමාගමේ කොටස් ප්‍රාග්ධනය සඳහා වන මුළු ආයෝජනය රු. මිලියන 300 ක් වන අතර එය 2018 අවසානය වන විට රුපියල් බිලියන 1 දක්වා වැඩි විය.

**2013 සිට 2018 දක්වා නැව්වෙල්ත් කෝපරේෂන් සමාගම සහ නැෂනල් වෙලත් සිකියුරිටීස් සමාගමෙහි මෙහෙයුම් ප්‍රතිපල**

| වර්ෂය | ලාභය/අලාභය | | මුළු එකතුව රු. (මි) |
|---|---|---|---|
| | නැව්වෙල්ත් කෝපරේෂන් රු.(මි) | නැෂනල් වෙලත් සිකියුරිටීස් රු.(මි) | |
| 2013 | (1.4) | 127.5 | 126.1 |
| 2014 | 60.9 | 516.6 | 577.5 |
| 2015 | 112.2 | (200.2) | (88.0) |
| 2016 | (65.8) | (499.2) | (564.9) |
| 2017 | 5.7 | 163.4 | 169.0 |
| 2018 | 8.9 | (242.5) | (233.5) |
| **ශුද්ධ ප්‍රතිඵලය** | **120.5** | **(134.4)** | **(13.8)** |

2018 අගෝස්තු 23 වෙනි දින එවකට විෂය භාර අමාත්‍යවරයා වූ ගරු උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය ආචාර්ය විජේදාස රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාව අනුව NWCL සමාගම සමඟ පැවති ආයෝජන කළමනාකරණ ගිවිසුම අහෝසි කිරීමටත් මහපොළ අරමුදල ලංකා බැංකු මහපොළ ගිණුමට මාරු කිරීමටත් NWSL සමාගම සුදුසු ගැනුම්කරුවෙකු තෝරාගෙන එම සමාගමේ කොටස් විකිණීමටත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවිය. ඒ අනුව NWSL හි කොටස් විකිණීමට අදාල ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කොට ඇත.

### ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT)

කොළඹ දිස්ත්‍රික්කයේ මාලඹේ පිහිටි අක්කර 25ක ඉඩම තුල SLIIT නමින් තොරතුරු තාක්‍ෂණය පිළිබඳ ආයතනයක් ආරම්භ කිරීම සඳහා මහපොළ භාරකාර මණ්ඩලයේ භාරකරුවන් විසින් අවසර ලබා දෙන ලදී. එහි තොරතුරු තාක්ෂණය සම්බන්ධයෙන් ශාස්ත්‍රපති උපාධි, ඩිප්ලෝමා සහ පාඨමාලා පවත්වනු ලබයි. මූලික අධියරේදී පහත පාඨමාලා යෝජනා කරන ලදී.

- විද්‍යාවේදී තොරතුරු තාක්ෂණ උපාධිය
- තොරතුරු තාක්ෂණ පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා
- විද්‍යාවේදී තොරතුරු තාක්ෂණ උපාධිය - පරිවර්තන පාඨමාලා
- තොරතුරු තාක්ෂණ ආශ්‍රිත ඩිප්ලෝමා
- තොරතුරු තාක්ෂණ අලෙවිකරණය ආශ්‍රිත ඩිප්ලෝමා
- සහතිකපත්‍ර මට්ටමේ කෙටිකාලීන පාඨමාලා

ඒ අනුව, තොරතුරු තාක්ෂණ ආයතනයට අවශ්‍ය යටිතල පහසුකම් හා ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා 1999 දී රු.මි. 500 ක් ආයෝජනය කිරීමට මහපොළ භාරකාර මණ්ඩලයේ භාරකරුවන් තීරණය කර ඇත. ඒ අනුව ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය ඇපයෙන් සීමිත සමාගමක් ලෙස පිහිටුවන ලදී.

### අධ්‍යයන කටයුතු ආරම්භ කිරීම

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය 2000 ජනවාරි කොල්ලුපිටියේ BOC මර්චන්ට් ටවර් ගොඩනැගිල්ලේදී සිසුන් 400 කගේ සහභාගීත්වයෙන් පිහිටුවන ලදී.

වර්තමානයේ එය උපාධි අපේක්ෂකයන්ට හා පශ්චාත් උපාධි අපේක්ෂකයන් 7000කට වඩා වැඩි පිරිසක් පාඨමාලාවන් සාර්ථකව නිම කරන අතර ජාත්‍යන්තර සිසුන්ද මේ සඳහා ඇතුලත් වී ඇත. 9000 කට අධික විද්‍යාර්ථයින් ව්‍යාපාර, පරිගණක හා ඉංජිනේරු පීඨයන්හි උපාධි ලබා ඇත.

තවදුරටත්, SLIIT විසින් ප්‍රමුඛ පෙළේ බහුජාතික සමාගම් හා ශ්‍රී ලාංකික ආයතන සඳහා කාර්මික සීමාවාසික පුහුණුව සඳහා සිසුන් යොමු කරනු ලබයි. එහිදී, ඔවුන්ගේ වෘත්තීය පුද්ගල විශේෂතා වර්ධනය කිරීම හා ඔවුන් ලබා ගන්නා දැනුම ප්‍රයෝගිකව භාවිතය සඳහා අවස්ථාව උදාකර දෙනු ලැබේ.

2015 වර්ෂයේදී SLIIT ආයතනය හා මහපොළ අරමුදල අතර බදු ගිවිසුමක් හා වත්කම් පැවරීමේ ගිවිසුමකට එළඹ ඇති අතර වාර්ෂිකව රු. මිලියන 20 ක් බදු කුලී වශයෙන් SLIIT ආයතනය මහපොළ අරමුදල වෙත ගෙවයි. මෙම ගිවිසුම සම්බන්ධව මහපොළ භාර අරමුදලේ නිසි අනුමැතිය ලැබී නොමැති බව දක්වෙන අතර ඒ සම්බන්ධව වංචා හා දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ හා ජනාධිපති විශේෂ විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන පැවැත්වෙන අතර එම විමර්ශන 2018 දෙසැම්බර් වන විට අවසන් කොට නොතිබුණි.

## 2019 පළමු මස 06 ඇතුලත්වන කළමනාකරණ ගිණුම්
## 2019 ජූනි 30 දිනෙන් අවසන් කාලඡේදය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

| ආදායම | සටහන් | 30.06.2019<br>රු. | 30.06.2018<br>රු. | වර්ධනය |
|---|---|---|---|---|
| පොළී ආදායම - භාණ්ඩාගාර බැඳුම්කර | 1 | 358,345,357 | 296,552,771 | **21%** |
| පොළී ආදායම - භාණ්ඩාගාර බිල්පත් | 2 | 18,134,052 | 7,157,882 | |
| පොළී ආදායම - වත්කම් පිටුබලය සහිත විශ්වාසය | 3 | 17,248,300 | 20,800,755 | |
| පොළී ආදායම - ස්ථාවර තැන්පතු | 4 | 119,987,950 | 32,348,746 | |
| පොළී ආදායම - ණයකර | 5 | 78,179,374 | 80,336,568 | |
| පොළී ආදායම - වාණිජ පත්‍ර | | - | 15,855,705 | |
| පොළී ආදායම - කෙටිකාලීන තැන්පතු | 6 | 27,714,313 | 18,944,020 | |
| ප්‍රාග්ධන ලාභ සාක්ෂාත් කර ගැනීම | | 1,973,079 | - | |
| **මුළු ආයෝජන ආදායම** | | **621,582,425** | **471,996,447** | **32%** |
| සෘජු වියදම් | | | | |
| කළමනාකරණ මුදල් - NWCL | | - | (14,805,079) | |
| භාරකාර ගාස්තු - ලංකා බැංකු ව (NWCL) | | - | (1,056,122) | |
| භාරකාර ගාස්තු - ලංකා බැංකු ව( MTF) | | (932,000) | - | |
| මූල්‍ය වියදම් - භාණ්ඩාගාර බැඳුම්කර අධිමිල | | (970,768) | (3,732,110) | |
| ලංකා බැංකු ණය පොළී වියදම | | (35,331,626) | - | |
| **ශුද්ධ ආයෝජන ආදායම** | | **584,348,031** | **452,403,136** | **29%** |
| **වෙනත් ආදායම්** | | | | |
| DLB ලාභ කොටස | | 500,782,697 | 293,735,280 | |
| SLIIT බදු කුලිය | | 10,000,000 | 10,000,000 | |
| වෙනත් ආදායම් | | 50,425 | 1,876,730 | |
| **මුළු වෙනත් ආදායම්** | | **510,833,122** | **305,612,010** | |
| **මුළු ආදායම** | | **1,095,181,153** | **758,015,146** | |
| **වියදම්** | | | | |
| ශිෂ්‍යත්ව ගෙවීම් | | (344,445,136) | (662,783,395) | |
| වේතන | | (7,174,260) | (6,352,755) | |
| වෙනත් පරිපාලන වියදම් | | (8,186,462) | (6,941,196) | |
| ක්ෂය | | (28,829,022) | (28,019,523) | |
| මුළු වියදම් | | **(388,634,880)** | **(704,096,869)** | |
| වියදම් ඉක්මවූ ශුද්ධ ආදායම | | **706,546,273** | **53,918,277** | |
| බදු පෙර ශුද්ධ ලාභය / අලාභය | | 706,546,273 | 53,918,277 | |
| ආදායම් බදු ප්‍රතිපාදන | | (98,916,478) | - | |
| | | **607,629,795** | **53,918,277** | |
| මුළු බදු පසු ආදායම | | **607,629,795** | **53,918,277** | |

# ආයතනික යහපාලනය

## භාරකාර මණ්ඩලය

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ ඉහළම බල අධිකාරිය භාරකාර මණ්ඩලය වන අතර, සුදුසු පරිදි මෙහෙයුම් ඉටුකිරීම හා අරමුදලේ කළමනාකරණය සම්බන්ධයෙන් වගකීම දරයි. සභාපතිවරයා වශයෙන් ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍රවිනිශ්චයකාරවරයා කටයුතු කරන අතර විෂයභාර අමාත්‍යවරයා ප්‍රාරම්භක භාරකරු නියෝජනය කරමින් භාරකාර මණ්ඩලයේ කටයුතු මෙහෙයවයි. භාරකාර මණ්ඩලය, නිල බලයෙන් පත්වන භාරකරුවන් හා විෂයභාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන භාරකරුවන්ගෙන් සමන්විත වන අතර එහි සංයුතිය පහත දැක්වේ.

1. ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍රවිනිශ්චයකාරවරයා නිල බලයෙන් අරමුදලේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරයි.
2. උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා ප්‍රාරම්භක භාරකරු නියෝජනය කරමින් භාරකරුවෙකු වශයෙන් කටයුතු කරයි.
3. උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා නිල බලයෙන් භාරකරුවෙකු වේ.
4. අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා නිල බලයෙන් භාරකරුවෙකු වේ.
5. වෙළඳ විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා නිල භාරකරුවෙකු වේ.
6. විෂය භාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙකු භාරකාර මණ්ඩලය නියෝජනය කරයි.
7. අතිගරු ජනාධිපතිවරයා විසින් පත්කල අධීක්ෂකවරයෙක්

## සභාපති/ භාරකාර මණ්ඩලය

1. ආයතනික පාලනයේ යහ පැවැත්ම තහවුරු කිරීම සභාපතිවරයා ඇතුළු භාරකාරවරයාගේ වගකීම වේ.
2. භාරකාර මණ්ඩල රැස්වීම්වල මුලසුන දරමින් නිසි ක්‍රමවේදයක් අනුගමනය කරන බැව් තහවුරු කළයුතු වේ.
3. භාරකරුවන් සියලුම දෙනාට සමාන අයුරින් සැලකිය යුතු අතර, විශේෂඥතා පවතින ක්ෂේත්‍රවලට උපරිම දායකත්වය දරමින් ඵලදායක භූමිකාවක නිරත වන බවට ඔවුන් සියලු දෙනාම දිරිමත් කළයුතු වේ.
4. භාරකාර මණ්ඩල කාර්ය භාරය සම්බන්ධයෙන් වන අවසන් තීන්දු තීරණ ගැනීමේ බලතල භාරකාර මණ්ඩලය සතුව පවතින බව සභාපතිවරයා විසින් සහතික කළයුතු වේ.
5. වගකීම් පැහැදිලි ලෙස බෙදීගොස් ඇති බව සහතික කළයුතු බව හා බලය හා අධිකාරීත්වය අතර සමතුලිතභාවයක් පවත්වා ගැනීමට සහාය වීම සභාපතිගේ වගකීමකි.

### භාරකාර මණ්ඩලයේ භූමිකාව

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල මගින් ස්ථාපිත අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම උදෙසා රජයේ ප්‍රතිපත්තිවලට අනුකූල වන පරිදි හඳුනාගත් දිසානතිය ඔස්සේ ආයතනය ප්‍රගමනාත්මක ලෙස මෙහෙය වීමේ සහ මෙහෙයුම් සාර්ථක ලෙස කළමනාකාරීත්වය වන ලෙස සහතික කිරීමේ වගකීම් භාරකාර මණ්ඩලය වෙත පැවරේ. සම්පත් විනිවිද භාවයකින් යුතුව උපයෝගී කර ගැනීම නිවැරදි ගිණුම් තොරතුරු පවත්වා ගැනීම සහ සියලුම ව්‍යවස්ථාපිත නියාමන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි නිවැරදි වාර්තා පවත්වා ගැනීම සම්බන්ධයෙන් භාරකාර මණ්ඩලය විසින් වගකීම දරයි.
පහත කාර්යයන් තහවුරු කිරීම භාරකාර මණ්ඩලයේ වගකීම වේ.

1. ආයතනයේ උපාය මාර්ගවල ඉලක්ක පිහිටුවාගෙන ඇති බව තහවුරු කිරීම.
2. උපාය මාර්ගවල ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා මඟපෙන්වීම හා නායකත්වය ලබාදීම.
3. ප්‍රධාන නිලධාරියා සහ සේවක කණ්ඩායම් සතුව අවශ්‍ය නිපුණතා දැනුම් හා සක්‍යතා සියල්ල පවතින බව සහතික කිරීම.
4. කාර්යක්ෂම පාලන හා අවදානම් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සහතික කිරීම.
5. ආයතනයේ කළමනාකරණ කාර්යයන් සාර්ථකව අධීක්ෂණය කරන බව සහතික කිරීම.
6. මූල්‍යමය ගණුදෙනු සම්බන්ධයෙන් පාර්ශවකරුවන් ලෙස ප්‍රමාණවත් ලෙස වාර්තාකරණය සිදු කරන බව හා අවශ්‍ය හෙළිදරව් කිරීම් කරන බව සහතික කිරීම.
7. සම්පත් හා වත්කම් වගකීම් ලෙස උපකල්පනය කරන බව සහතික කිරීම.
8. භාරකාර මණ්ඩලය විසින් ආයෝජන කමිටුව,විගණන කමිටුව පත්කිරීම හා කටයුතු අධීක්ෂණය
9. පිළිවෙත් හා ආචාර ධර්ම සංග්‍රහයක් ආයතනික පාලන උපාය මාර්ගයක් හඳුන්වාදීම.
10. තම සියලුම කාර්යයන් අදාල ව්‍යවස්ථාපිත විධි විධාන මාර්ගඋපදේශනය හා චක්‍රලේඛ වලට අනුකූලව ඉටුකිරීම භාරකාර මණ්ඩලයේ වගකීමකි.

**භාරකාර මණ්ඩල රැස්වීම්**

භාරකාර මණ්ඩල රැස්වීම් වලදී ආයතනික මෙහෙයුම් හා ප්‍රතිඵල අනුමත කරගත් අයවැය හා අදාල ප්‍රමිතීන්ට සාපේක්ෂව ඉතා සූක්ෂම ලෙස නිරීක්ෂණය කිරීම හා අධීක්ෂණය කිරීම භාරකාර මණ්ඩලය විසින් සිදුකරනු ලබයි. මෙහිදී භාරකාර මණ්ඩලය සම්මත න්‍යාය පත්‍රයක් සහ අනෙකුත් සාකච්ඡා කල කාරණා කෙරෙහි අවධානය යොමු කරයි. සියලුම භාරකාර මණ්ඩල රැස්වීම් වාර්තා සභාපතිවරයා විසින් අනුමත කොට සහතික කරයි. භාරකාර මණ්ඩලය මාස 02 කට වරක් රැස්වන අතර, අවශ්‍යතා පැන නැඟුනවිට විශේෂ භාරකාර මණ්ඩල රැස්වීම් ද පවත්වනු ලබේ. 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුල දී පවත්වන ලද භාරකාර මණ්ඩල රැස්වීම් සහ භාරකරුවන්ගේ සහභාගී වූ තොරතුරු පහත පරිදි වේ.

| | භාරකරු/භාරකරුවන් | තනතුර | පැවැත්වූ රැස්වීම් ගණන | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | 1 | 2 | 3 | 4 | 5 |
| 1 | ගරු ප්‍රියසාද් ඩෙප් මහතා | අග්‍රවිනිශ්චයකාරතුමා | √ | √ | √ | √ | √ |
| 2 | ගරු මලික් සමරවික්‍රම මහතා | සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය | √ | --- | -- | --- | -- |
| 3 | ආචාර්ය විජේදාස රාජපක්ෂ මහතා | උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය | -- | √ | √ | √ | √ |
| 4 | චාන්දනී විජේවර්ධන මහත්මිය | ලේකම්, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය | √ | --- | -- | --- | -- |
| 5 | ජේ.ජේ.රත්නසිරි මහතා | ලේකම්, උසස් අධ්‍යාපන හා සංස්කෘතික හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය | -- | √ | √ | √ | √ |
| 6 | ඩී.ඩී.දිසානායක මහතා | ලේකම්, උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය | √ | --- | -- | --- | -- |
| 7 | එස්.එස්.හෙට්ටිආරච්චි මහතා | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය | √ | √ | -- | -- | -- |
| 8 | එස්.වී.ඩී.කේසරලාල් ගුණසේකර | පත්කල භාරකරු | | √ | √ | √ | √ |
| 9 | ආචාර්ය වික්‍රම වීරසූරිය මහතා | පත්කල භාරකරු | √ | --- | -- | --- | -- |
| 10 | වෛද්‍ය ඩී.කේ.ඩී.මැතිවු මහතා | පත්කල භාරකරු | | √ | √ | √ | √ |
| 11 | නීතිඥ අනිල් රාජකරුණා මහතා | පත්කල භාරකරු | √ | --- | -- | --- | -- |


√ - සහභාගී වූ රැස්වීම් ගනන

---- - භාරකාර මණ්ඩලයෙන් ඉවත් වී ඇත.

**භාරකාර මණ්ඩල සතු කමිටු**

1. කළමනාකරණ හා විගණන කමිටුව
2. ආයෝජන කමිටුව
3. ටෙන්ඩර් මණ්ඩල කමිටුව
4. සේවක සුභ සාධක මණ්ඩල කමිටුව

# ආයතනික ව්‍යුහය


භාරකාර මණ්ඩලය
පාලක/අධ්‍යක්ෂ (භාරකාර මණ්ඩලය විසින් පත් කරන ලද)
අධ්‍යක්ෂ (ආයෝජන) (1)
අධ්‍යක්ෂ (පරිපාලන හා මූල්‍ය) (1)
කළමනාකරු/ නි.අ (ව්‍යාපෘති) (1)
සහකාර අධ්‍යක්ෂ /නි.අ (මූල්‍ය) (1)
සහකාර අධ්‍යක්ෂ/නි.අ (පරිපාලන) (1)
අභ්‍යන්තර විගණක (1)
කණිෂ්ඨ කළමනාකරු (1)
කණිෂ්ඨ කළමනාකරු (1)
කළමනාකරණ සහකාර (3)
කළමනාකරණ සහකාර (7)
පොත් තබන්නා (1)
කළමනාකරණ සහකාර (3)
විගණන නිලධාරීන් (3)
රියදුරු (1)
කාර්යාල කාර්ය සහායක (1)
කාර්යාල කාර්ය සහායක (1)
කාර්යාල කාර්ය සහායක (1)
කාර්යාල කාර්ය සහායක (1)

කාර්යය මණ්ඩලය

| සේවා ශ්‍රේණිය | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 1 | 1 | |
| ද්විතීය | 6 | 2 | 4 |
| තෘතීය | 19 | 8 | 11 |
| ප්‍රමුඛ | 5 | 2 | 3 |
| එකතුව | 31 | 13 | 18 |

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල අවම කාර්යය මණ්ඩල පිරිවැයක් දරණ ආයතනයක් ලෙස එහි ආරම්භයේ සිටම ඉතා සීමිත කාර්යය මණ්ඩලයක් මගින් කටයුතු කරන අතර කාර්යය මණ්ඩල පරිපාලන වියදම ආදායමෙන් 0.26% ක් වූ අතර වියදමින් 0.40% වැනි ඉතා අවම මට්ටමක තබා ගත හැකි විය.

කාර්යය මණ්ඩලයෙහි දැනට පවතින ඇබෑර්තු අභ්‍යන්තර උසස් කිරීම් මගින් පිරවීමටත් ඉන්පසු ඇතිවන තනතුරු සඳහා ඇබෑර්තු බාහිර අයදුම්කරුවන්ගෙන් පිරවීමටත් භාරකාර මණ්ඩලය තීරණය කර ඇත.

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. TCM2/F/MTF/6/18/14
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2019 ඔක්තෝබර් 31 දින

සභාපති
ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

**ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව  இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை  No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34  +94 11 2 88 72 23  ag@auditorgeneral.gov.lk  www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගිණුම්කරණ ප්‍රමිතිවලින් බැහැරවීම

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 හි 4.1.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය වත්කම් එහි ක්‍රමක්ෂය පිරිවැය, වෙනත් විස්තීරණ ආදායමක් හරහා සාධාරණ වටිනාකම, ලාභය හෝ අලාභය තුළින් සාධාරණ වටිනාකම යනාදී වශයෙන් වර්ගකර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවත් වටිනාකම රු.10,232,401,250 ක් වූ මූල්‍ය වත්කම් එසේ දක්වා නොතිබුණි.

(ආ) ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) භාර අරමුදලේ පූර්ණ අයිතිය සහිත පරිපාලන සමාගම් දෙකක් වන නැෂනල් වෙල්ත් කෝපරේෂන් හා නැට්වෙල්ත් සිකියුරිටීස් යන සමාගම් සමඟ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 2005 වර්ෂයේදී වටිනාකම රු.12,460,179 කට ගිණුම්ගත කර තිබූ භාර අරමුදල සතු මාලබේ පිහිටි අක්කර 25 ක ඉඩම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය සමඟ කල්බදු පදනම යටතේ ගිවිසුමකට එළඹ තිබූ අතර, සමාලෝචිත වර්ෂය වන විටත් එම ඉඩම වර්තමාන වටිනාකමට අගය කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(iii) භාර අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ක්ෂය ප්‍රතිපත්තිය අනුව දේපළ, පිරියත හා උපකරණ එම වත්කම ප්‍රයෝජනයට ගැනීම ආරම්භ කළ දිනයේ සිට ක්ෂය කළ යුතු වුවත් 2018 වර්ෂය තුළ මිලදී ගත් පිරියත හා උපකරණ මිලදී ගත් දිනය නොසලකා සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කර තිබීම නිසා රු.181,457 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයට අදාල වෛද්‍ය හා හදිසි අනතුරු රක්ෂණ වියදම රු.87,500 ක් වුවද, ඉදිරියට කළ ගෙවීම රු.360,572 ඇතුළත් සමාලෝචිත වර්ෂයේ වියදම් රු.448,072 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(v) සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 11 (1) (ආ) වගන්තිය ප්‍රකාරව මහපොළ භාර අරමුදල සංවර්ධන ලොතරැයි මණ්ඩලය පිහිටුවීමේදී සිදුකර තිබූ ආයෝජන ප්‍රතිශතයට අනුපාතික අතිරික්තය ප්‍රේෂණය කළ යුතුයි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේ අතිරික්තයෙන් අරමුදලට හිමි කොටස රු. 1,093,798,978 ක් වුවද එය රු. 189,198,591 .ක් අඩුවෙන් රු. 904,600,387 ක් පමණක් මූල්‍ය ප්‍රකාශනවලද දක්වා තිබුණි.

(vi) 2012 වර්ෂයේ සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා වූ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අතිරික්තයෙන් භාර අරමුදලට ලැබිය යුතුව තිබූ නමුත්, ජනාධිපති අරමුදල විසින් එවා නොතිබූ රු.835,766,892 ක් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අරමුදල පවත්වාගෙන ගොස් තිබුණි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (ආ) ඡේදයේ (1) සහ (v) යටතේ දක්වා ඇති නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව භාර අරමුදලේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට භාර අරමුදලට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාහාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | විස්තරය |
|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය | ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2018 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2019 ජුලි 31 දිනදීය |

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

3. අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) පාසල් කිහිපයක සිදු කරනු ලැබූ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් පාසැල් සංවර්ධන අරමුදලින් ගෙවිය යුතු වියදම් ලෙස එකතුව රු.3,832,875 ක් 2013 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අතර ඒ සම්බන්ධයෙන් කිසිවෙකු ඉල්ලුම් කර නොමැති බැවින් එය නිශ්චිතව ම ගෙවිය යුතු බවට හඳුනා ගත නොහැකි වී තිබුණි.

(ආ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව සෑම ප්‍රසම්පාදන අස්ථිත්වයක් විසින්ම ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කළ යුතු අතර එහි අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කර තිබිය යුතු වුවත් අරමුදල විසින් ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.

(ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය අනුව සංයුක්ත සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාලව සංයුක්ත සැලැස්මක් සහ ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඈ) ක්‍රියාකාරිත්වය සමාලෝචනය

(i) අධ්‍යාපනය සැලසීමේ නිරත වන පාසල්, ආයතන, පදනම් සහ එවැනි ආයතන පිහිටුවීම සහ කළමනාකරණය කිරිම, වෘත්තීය නිපුණතා සහ දක්ෂතා වැඩි දියුණු කර ගැනීමට හැකි වන පරිදි වෘත්තීය අභ්‍යාස, ආයතන පිහිටුවීම සහ කළමනාකරණය කිරීම හෝ පිහිටුවීමට සහ කළමනාකරණය කිරීමට සහයවීම, අධ්‍යාපනය සැලසීමේ නිරතව සිටින කථිකාචාර්යවරුන්ගේ, ගුරුවරුන්ගේ සහ එවැනි වෙනත් තැනැත්තන්ගේ නිපුණතා සහ දක්ෂතා නංවාලීම සහ වැඩිදියුණු කිරීම සඳහා ආධාර සැලැසීම යන භාර අරමුදල් පනතේ 6.1 වගන්තියේ සඳහන් අරමුණු ඉටුකිරීම කෙරෙහි සමාලෝචිත වර්ෂයේදී අරමුදල විසින් අවධානය යොමුකර නොතිබුණි.

(ii) ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන්) සීමිත සමාගම (SLIIT) සමඟ 2005 නොවැම්බර් 14 සහ 2015 මැයි 12 දින එළඹි ගිවිසුම් සහ 2017 අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කල අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලද අනුමැතිය අනුව භාර අරමුදලට SLIIT ආයතනය සම්බන්ධයෙන් තිබූ අයිතිය අහිමි කර තිබුණි. තව ද 2015 එළඹි ගිවිසුම වැරදි බවට අල්ලස් හා දූෂණ විමර්ශන කොමිසමේ හා ජනාධිපති විශේෂ විමර්ශන කොමිසම යටතේ විමර්ශන 2 ක් විභාග වෙමින් පැවැති අතර 2019 ජූලි 12 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ ශිණුම්කාරක සභා රැස්වීමේ දී SLIIT ආයතනය සම්බන්ධයෙන්

ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳ මාසයක් ඇතුළත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් සහ භාර අරමුදලේ සභාපති වෙත දන්වා තිබූ නමුත් මෙම වාර්තාවේ දිනය වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

(iii) 2018 සැප්තැම්බර් 05 දිනැති අංක අමප/18/1873/824/020 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව භාර අරමුදල නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම සමඟ එළඹී ආයෝජන කළමනාකරණ ගිවිසුම අවලංගු කර තිබුණි. ඒ අනුව 2019 පෙබරවාරි 28 දින නැෂනල් වෙල්ත් කෝපරේෂන් විසින් කළමනාකරණය කරන ලද ආයෝජන කළඹ ලංකා බැංකු ආයතනික ශාඛාවේ මහපොළ භාර අරමුදල සතු ප්‍රධාන ගිණුම වෙත මාරු කර තිබුණි. තවද එම අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම ඈවර කිරීම හා නැට්වෙල්ත් සිකියුරිටීස් සමාගම විකිණීම සිදුකල යුතු වුවත් මෙතෙක් එය සිදුකර නොතිබුණි.

(iv) ඉහත (iii) සඳහන් කටයුතු ක්‍රියාත්මක නොකර මහපොළ භාර අරමුදල විසින් ලංකා බැංකුවෙන් ලබාගත් රු.බිලියන 4 ක ණය පහසුකමක් මත ලබාගත් රු.බිලියන 1.111 ක ණය මුදලෙන් නැට්වෙල්ත් සිකියුරිටීස් සමාගමේ භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත් 2019 මාර්තු 26 දින මිල දී ගෙන නැවත එය 2019 මාර්තු 27 දින රු.බිලියන 1.113 කට විකුණා තිබූ අතර එම මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර 2019 ජුනි 27 දින එම ණය පියවා තිබුණි.

(v) භාර අරමුදල් පනතේ 6.2(අ) (ඇ) (ඈ) වගන්ති අනුව මුදල් සපයා ගැනීම සඳහා දේශීය හෝ විදේශීය මූලාශ්‍ර වලින් හෝ ද්‍රව්‍ය වලින් ප්‍රදාන, තෑගී හෝ පරිත්‍යාග භාර ගැනීමට හා ආණ්ඩුවේ අනුමැතිය ඇතිව ලොතරැයි පැවැත්වීමට බලය භාර අරමුදලට ලැබී තිබුණි. එසේ වුවද එවැනි මූලාශ්‍ර මඟින් අරමුදල් සපයා ගැනීමට කටයුතු නොකර විශ්ව විද්‍යාල සිසුන් සඳහා ලබා දෙනු ලබන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්වය සඳහා ආරම්භයේ දී සම්පූර්ණ දායකය මහපොළ භාර අරමුදලින් සිදුකළ ද පසුකාලීනව දායකත්වයෙන් සියයට 49 ක් රජය විසින් ලබාදීමට කටයුතු කර තිබුණි.

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න
විගණකාධිපති

මූල්‍ය ප්‍රකාශන

2018 දෙසැම්බර් 31

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල
**2018 දෙසැම්බර් මස 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

| | සටහන් | 2018 | 2017 |
|---|---|---|---|
| **වත්කම්** | | රු. | රු. |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ , පිරියත සහ උපකරණ | 12 | 913,888,938 | 967,925,338 |
| ආයෝජන දේපළ | 13 | 12,460,179 | 12,460,179 |
| පරිපාලිත සමාගම්වල ආයෝජනය | 14 | 985,000,000 | 985,000,000 |
| වෙනත් ආයෝජන | 15 | 2,200,000 | 2,200,000 |
| මූල්‍ය වත්කම් | 16 | 10,232,401,250 | 9,861,439,390 |
| | | **12,145,950,367** | **11,829,024,907** |
| **ජංගම වත්කම්** | | | |
| වෙනත් වත්කම් | 17 | 2,287,729 | 1,995,810 |
| අත්තිකාරම් සහ පෙර ගෙවුම් | 18 | 1,579,729 | 1,797,859 |
| ලැබිය යුතු දෑ | 19 | 155,363,740 | 57,450,549 |
| මුදල් හා මුදල් සමාන දෑ | 20 | 140,608,323 | 7,150,101 |
| | | **299,839,521** | **68,394,319** |
| **මුළු වත්කම්** | | **12,445,789,888** | **11,897,419,226** |
| **මුළු ස්කන්ධය සහ බැරකම්** | | | |
| **ස්කන්ධය සහ බැරකම්** | | | |
| උපචිත අරමුදල | | 10,147,376,951 | 10,147,376,951 |
| ශුද්ධ අතිරික්තය | | 2,148,934,763 | 1,697,374,151 |
| **මුළු සාමාන්‍ය කොටස්** | | **12,296,311,714** | **11,844,751,102** |
| **ජංගම නොවන බැරකම්** | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 21 | 3,172,760 | 2,173,542 |
| | | **3,172,760** | **2,173,542** |
| **ජංගම බැරකම්** | | | |
| උපචිත සහ වෙනත් ගෙවිය යුතු දෑ | 22 | 146,305,414 | 50,494,582 |
| | | **146,305,414** | **50,494,582** |
| **මුළු ස්කන්ධය සහ බැරකම්** | | **12,445,789,888** | **11,897,419,226** |

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා මහපොළ භාරකාර මණ්ඩලය වගකීම් දරනු ලබයි. භාරකාර මණ්ඩලය වෙනුවට සහ වෙනුවෙන් අත්සන් තබනු ලැබේ:

| | | |
|---|---|---|
| අත්සන් කලේ | අත්සන් කලේ | අත්සන් කලේ |
| එම්.එම්.පී .කේ මායාදුන්නේ මහතා | එස්.වී.ඩී.කේ.ගුණසේකර මහතා | එම්.පරාක්‍රම බණ්ඩාර මහතා |
| ලේකම් | පත්කරන ලද භාරකරු | අධ්‍යක්ෂ |
| නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය නිල බලයෙන් මහපොළ භාර අරමුදලෙහි භාරකරු | මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල | මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල |

පිටු අංක 05 සිට 22 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල ප්‍රධාන කොටසක් වේ.

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

**2018 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය**

| | සටහන් | 2018 | 2017 |
|---|---|---|---|
| | | රු | රු |
| ආදායම | 7 | 1,868,593,335 | 1,117,644,199 |
| සෘජු වියදම් | 8 | (1,325,566,790) | (1,256,329,028) |
| | | 543,026,545 | (138,684,829) |
| වෙනත් ආදායම් | 9 | 3,753,459 | 2,906,632 |
| **මුළු ආදායම** | | **546,780,004** | **(135,778,197)** |
| පරිපාලන වියදම් | 10 | (95,219,392) | (75,078,310) |
| පාසල් සංවර්ධන වියදම් | 11 | - | (16,683,385) |
| **මුළු වියදම්** | | **(95,219,392)** | **(91,761,695)** |
| **වියදම් වලට වඩා ශුද්ධ ආදායම** | | **451,560,612** | **(227,539,892)** |
| **බදු වලට පෙර අතිරික්තය / (ඌනතාව)** | | **451,560,612** | **(227,539,892)** |
| **ආදායම් බදු සඳහා වියදම්** | | - | - |
| **ශුද්ධ අතිරික්තය / (ඌනතාව)** | | **451,560,612** | **(227,539,892)** |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | - | - |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ වියදම්** | | **451,560,612** | **(227,539,892)** |

පිටු අංක 05 සිට 22 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල ප්‍රධාන කොටසක් වේ.

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල
සාමාන්‍ය කොටස් වෙනස්වීම පිළිබඳ ප්‍රකශනය

| | උපචිත අරමුදල | ශුද්ධ අතිරික්තය / ඌනතාව | මුළු මුදල |
|---|---|---|---|
| | රු | රු | රු |
| **2017 ජනවාරි මස 01 වන දිනට ශේෂය** | 10,147,376,951 | 1,952,998,663 | 12,100,375,614 |
| වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය / (ඌනතාව) | - | (227,539,892) | (227,539,892) |
| NWCL වෙතින් ලැබිය යුතු ඉක්මවා සපයන ලද පොළිය | - | (28,084,620) | (28,084,620) |
| **2017 දෙසැම්බර් මස 31 වන දිනට ශේෂය** | **10,147,376,951** | **1,697,374,151** | **11,844,751,102** |
| වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය / (ඌනතාව) | - | 451,560,612 | 451,560,612 |
| **2018 දෙසැම්බර් මස 31 වන දිනට ශේෂය** | **10,147,376,951** | **2,148,934,763** | **12,296,311,714** |

පිටු අංක 05 සිට 22 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල ප්‍රධාන කොටසක් වේ.

**ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල**
**2018 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| | 2018<br>Rs. | 2017<br>Rs. |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය | | |
| ශුද්ධ අතිරික්තය / (ඌනතාව) | 451,560,612 | (227,539,892) |
| **ගැළපීම්:** | | |
| ක්ෂයවීම් | 56,039,045 | 54,751,056 |
| ස්ථාවර වත්කම් බැහැර කිරීමෙන් ලද ලාභය | (3,457,750) | (8,000) |
| පාරිතෝෂික සඳහා වියදම | 999,218 | 805,422 |
| කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට ප්‍රථම මෙහෙයුම් අතිරික්තය / (ඌනතාව) | **505,141,125** | **(171,991,414)** |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීම | | |
| ලැබිය යුතු දෑ වැඩිවීම / අඩුවීම | (97,986,980) | 88,739,370 |
| ගෙවිය යුතු දෑ වැඩිවීම / අඩුවීම | 95,810,832 | 39,738,861 |
| මෙහෙයුම් වලින් ලද මුදල් | (2,176,148) | 128,478,231 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ අභ්‍යන්තර මුදල් ප්‍රවාහ / බාහිර මුදල් ප්‍රවාහ | **502,964,977** | **(43,513,183)** |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය | | |
| දේපළ, පිරියත සහ උපකරණ අත්පත්කරගැනීම | (2,002,645) | (11,103,041) |
| ස්ථාවර වත්කම් බැහැර කිරීමෙන් ලද විකුණුම් ආදායම | 3,457,750 | 8,000 |
| මූල්‍යමය වත්කම් ආයෝජනය / (ආපසුගැනීම්) | (370,961,860) | (46,657,726) |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ අභ්‍යන්තර මුදල් ප්‍රවාහ / බාහිර මුදල් ප්‍රවාහ | **(369,506,755)** | **(57,752,767)** |
| මූල්‍යයන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ | | |
| ගෙවන ලද ලාභාංශ | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද අභ්‍යන්තර මුදල් ප්‍රවාහය / බාහිර මුදල් ප්‍රවාහය | - | - |
| මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ අඩුවීම / (වැඩිවීම) | 133,458,222 | (101,265,950) |
| 2018.01.18 දිනට මුදල් හා මුදල් සමාන දෑ | 7,150,101 | 108,416,051 |
| **2018.12.31 දිනට මුදල් හා මුදල් සමාන දෑ** | **140,608,323** | **7,150,101** |

පිටු අංක 05 සිට 22 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල ප්‍රධාන කොටසක් වේ.

**ආයතනික තොරතුරු**

**1.1 පොදු**

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල (භාරකාර අරමුදල) 1981 අංක 66 දරණ පර්ලිමේන්තු පනත යටතේ ස්ථාපනය කරන ලද භාර අරමුදලක් වන අතර මෙම භාර අරමුදලෙහි කළමනානාකරණය සහ පාලනය භාරකාර මණ්ඩලයක් වෙත පැවරී තිබේ. මෙම ආයතනය කොළඹ 07, ධර්මපාල මාවතේ අංක 191 දරණ ස්ථානයේ පිහිටි ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානයේ 4 වන මහලේ පිහිටා තිබේ.

**1.2 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම්වල ස්වභාවය**

මෙම අරමුදල වරප්‍රසාද නොලත් තරුණ තරුණියන් වෙත උසස් අධ්‍යාපනය ලබාගැනීම සඳහා මෙන් ම වැඩිදියුණු කළ පහසුකම් ඔස්සේ උසස් අධ්‍යාපනය සඳහා අවස්ථා නිර්මාණය කිරීමට ශිෂ්‍යත්ව පිරිනමනු ලබයි.

**1.2.1 මහපොළ භාර අරමුදල**

මෙම අරමුදලෙහි ඉලක්ක සහ අරමුණු වන්නේ :

(අ ) යෞවනයන් වෙත උසස් අධ්‍යාපනය සඳහා පහසුකම් ලබා දීම;

(ආ) ස්වකීය ද්විතියික අධ්‍යාපනය සතුටුදායක අන්දමෙන් සම්පූර්ණ කරන ලද උසස් අධ්‍යාපනය ලැබීමට යෝග්‍ය තරුණ තරුණියන්ට අවස්ථානුකූලව තම අධ්‍යාපනික, කාර්මික හෝ තාක්ෂණික අධ්‍යාපනය විශ්වවිද්‍යාලයක, හෝ තාක්ෂණ ආයතනයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක ලැබීම සඳහා සහයෝගය ලබාදීම;

(ඇ) යෞවනයන්ට ස්වකීය වෘත්තීය නිපුණතා සහ ප්‍රවීණතාව වැඩිදියුණු කර ගැනීමට හැකියාව සලසමින් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීම සහ කළමනාකරණයට සහයෝගය ලබා දීම;

(ඈ) පාසැල්, අධ්‍යාපන ආයතන, පදනම් සහ අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි උන්නතිය උදෙසා කටයුතු කරන එවැනි ආයතනය ස්ථාපනය කිරීම සහ එම ආයතන කළමනාකරණය සහ පවත්වාගෙනයාම සඳහා සහයෝගය ලබා දීම;

(ඉ) කථිකාචාර්යවරුන්ගේ, ගුරුවරුන්ගේ සහ අධ්‍යාපනයෙහි ඉදිරි ගමන උදෙසා කටයුතු කරන එබඳු පුද්ගලයන්ගේ නිපුණතා සහ ප්‍රවීණතාව ඉහළ නංවා ගැනීම සහ වැඩිදියුණු කිරීම.

**1.3 නිකුත් කිරීම සඳහා බලය පවරන ලද දිනය**

2019/07/24 දින පැවති භාරකාර මණ්ඩලයේ යෝජනා සම්මත කිරීම ප්‍රකාරව ලලිත් ඇතුලත්මුදලි මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදලෙහි 2018 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය පවරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා මූලික පදනම

### 2.1 අනුකූලතා ප්‍රකාශනය

2018 දෙසැම්බර් මස 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් ඇතුළත්ව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නියම කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) වලින් (මෙහි මින්මතු SLFRS වශයෙන් දැක්වේ) සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සකස් කර දක්වා තිබේ.

### 2.2 මිනුම්කරණ පදනම

වෙනත් ආකාරයකින් සඳහන් කර ඇත්තේ නම් මිස, උපචිත පදනම සහ ඓතිහාසික පිරිවැය පදනම මත මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබේ.
ආයතනයේ ව්‍යවහාරික සහ ඉදිරිපත් කෙරෙන මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබේ.

### 2.3 ප්‍රමාණාත්මකතාවය සහ සමාහරණය

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 (LKAS 01) අනුව සමාන අයිතම වල එක් එක් ප්‍රමාණාත්මක වර්ගය මූල්‍ය ප්‍රකාශන වල වෙන වෙනම ඉදිරිපත් කොට ඇත. අසමාන ස්වභාවයෙන් හෝ කෘත්‍යයෙන් යුතු අයිතම ඒවා ප්‍රමාණාත්මක නොවන්නේ නම් හැර, වෙන් වෙන්ව ඉදිරිපත් කොට ඇත.

හඳුනාගත් වටිනාකම හිලව් කිරීම බලාත්මක කළ හැකි නෛතික අයිතියක් පවතින්නේ නම් පමණක් මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ශුද්ධ වටිනාකම වාර්තා කරනු ලබන අතර එසේ සිදු කරනු ලබන්නේ ශුද්ධ පදනමක් මත පියවීමට නැතහොත් උපලබ්ධි කිරීමට සමගාමීව බැරකම් අවසන් කිරීමට අභිප්‍රායක් ඇත්තේ නම් පමණි. මූල්‍ය ප්‍රතිපත්තිවල විශේෂයෙන් සඳහන් කර ඇති ඕනෑම ගිණුම්කරණ ප්‍රමිතියක් අර්ථ දැක්වීමක් මඟින් නියම කර තිබේ නම් හෝ අවසර ලබාදී ඇත්නම් මිස ආදායම් ප්‍රකාශනයේ ආදායම් සහ වියදම් හිලව් කරනු නොලැබේ.

### 2.4 සංසන්දනාත්මක තොරතුරු

නව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) උපයෝගී කරගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් වෙනස් කිරීමට සිදු වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති හැර භාර අරමුදල විසින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ LKAS 01 ප්‍රකාරව පූර්ව වර්ෂයේ දී යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම වර්ෂයේදී ද ස්ථිර වශයෙන් ම භාවිතා කර තිබේ.

## 3. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

භාර අරමුදල විසින් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී උපයෝගී කරගන්නා ලද සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ. පහත දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනත් ආකාරයකින් දක්වා ඇත්නම් මිස මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා ඇති සියලුම කාල පරිච්ඡේද සඳහා නිත්‍ය වශයෙන්ම උපයෝගී කරගෙන තිබේ.

## 3.1 දේපළ, පිරියත සහ උපකරණ

### 3.1.1 හඳුනාගැනීමේ පදනම

සේවා සැපයීමේ සහ පරිපාලන කටයුතු සඳහා භාවිතා කරනු ලබන දේපළ, පිරියත සහ උපකරණ යන ස්පෘශ්‍ය අයිතම වර්ෂයකට වඩා වැඩි කාලයක් භාවිතා කිරීම අපේක්ෂා කෙරේ.

වත්කම් ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමේ හැකියාවක් පවතින්නේ නම් දේපළ, පිරියත හා උපකරණ හඳුනාගනු ලබන අතර වත්කම් සඳහා වන පිරිවැය විශ්වාසවන්තභාවයෙන් යුතුව ගණනය කළ හැකිය.

### 3.1.2 මිනුම්කරණ පදනම

වත්කම් වශයෙන් හඳුනාගැනීමට සුදුසු දේපළ , පිරියත සහ උපකරණ යටතේ වන අයිතමයක් මූලිකවම පිරිවැය අනුව මනිනු ලැබේ. අදාළ වත්කම් ලබාගැනීම සඳහා සෘජුවම ආරෝපණය කරනු ලබන වියදම සහ පසුව ඒ සඳහා කොටසක් එක් කිරීමට හෝ පැරණි කොටසක් වෙනුවට නව කොටසක් එක් කිරීම සඳහා වැය වන මුදල පිරිවැය සඳහා අන්තර්ගත වේ. ස්වයං නිර්මිත වත්කම් සඳහා අමුද්‍රව්‍ය වෙනුවෙන් වැයවන පිරිවැය සහ සෘජු ශ්‍රමය, අයිතම ගෙන ඒම, ඒවා තබනු ලබන ස්ථානයේ ස්ථානගත කිරීම සහ ප්‍රාග්ධනිත ණය ගැනීම් පිරිවැය ආදී සෘජුවම ආරෝපණය වන වෙනත් ඕනෑම ආකාරයේ පිරිවැය අන්තර්ගත වේ. මිලදී ගන්නා ලද මෘදුකාංගය අදාළ උපකරණයේ ක්‍රියාකාරීත්වය සඳහා අත්‍යවශ්‍ය වන්නේ නම් එය පරිගණක උපකරණයේ කොටසක් වශයෙන් ප්‍රාග්ධනිත කරනු ලැබේ.

දේපළ , පිරියත සහ උපකරණ යටතේ වන අයිතමයක කොටසක් සතුව විවිධ ඵලදායී ජීව කාල පවතින විට ඒවා දේපළ , පිරියත සහ උපකරණ වල වෙනම අයිතම (ප්‍රධාන සංරචක) වශයෙන් හඳුන්වනු ලැබේ.

ආයතනය විසින් දේපළ, පිරියත සහ උපකරණ ආකෘතිකරණය සඳහා වන පිරිවැය සහ මිලදී ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැය පිළිබඳ වාර්තා සහ අඩු සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණ අලාභ සඳහා වන ඕනෑම අනුශංගික වියදම් අදාළ කරගනු ලැබේ..

### 3.1.3 පසුකාලීන පිරිවැය

දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක කොටසක් තුළ ගැබ්ව ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය තුළට ගලා ඒමේ හැකියාවක් පවතින්නේ නම් හා එහි පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි නම්, එබඳු කොටසක ප්‍රතිස්ථාපන පිරිවැය එම අයිතමයෙහි ධාරණ අගයට හඳුනා ගැනේ. දේපළ, පිරියත සහ උපකරණ දෛනිකව සේවාකිරීම සඳහා වැය වන පිරිවැය, එය වැය වන අකාරයට ලාභ හෝ අලාභ වශයෙන් ප්‍රකාශනයට ඇතුළත් කරනු ලැබේ.

### 3.1.4 අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු

අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු ඒවා සිදුකරන ලද මූල්‍ය කාලයට අදාළව ලාභ හෝ අලාභ වශයෙන් සඳහන් කරනු ලැබේ. ප්‍රධාන ප්‍රතිසංස්කරණ සඳහා වන පිරිවැය වත්කම්වල ධාරණ අගයට ඇතුළත් කරනු ලබන අතර අතිරේක වශයෙන් ඇති වත්කම් වලින් ආසන්නතම කාලයේ දී හඳුනාගනු ලබන කොටසක් අනාගත ආර්ථික ප්‍රතිලාභ වශයෙන් ආදේශ කරනු ලැබේ. ප්‍රධාන ප්‍රතිසංස්කරණ කෙරෙහි අදාළ වත්කම්වල ඉතිරි ඵලදායී ජීව කාලයේ දී විරුද්ධතාවයක් දක්වනු ලැබේ.

### 3.1.5 හඳුනාගැනීම බැහැර කිරීම

දේපළ, පිරියත සහ උපකරණ බැහැර කරන්නේ නම් හෝ අනාගත ප්‍රතිලාභ අපේක්ෂා කළ නොහැකි නම් ඒවා හඳුනාගැනීමෙන් වැළකී සිටිනු ලැබේ. වත්කම් හඳුනාගැනීම බැහැර කිරීමෙන් ඇතිවන ඕනෑම ලාභ හෝ අලාභ (ශුද්ධ බැහැර කිරීමේ ලාභ සහ වත්කම් වල ධාරණ අගය අතර වෙනස වශයෙන් ගණනය කර) අදාළ වර්ෂයේ "වෙනත් මෙහෙයුම් ආදායම්" වශයෙන් හඳුනාගනු ලැබේ.

### 3.1.6 ක්ෂය වීම

වත්කම්වල අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභයන්හි අපේක්ෂිත පාරිභෝගික රටාව සමීප වශයෙන් පිළිබිඹු කරන බැවින් දේපළ, පිරියත සහ උපකරණ යන අයිතමයන්හි සෑම කොටසකම ඇස්තමේන්තුගත ජීව කාලය අනුව සරළ රේඛීය පදනම අනුව ලාභ හෝ අලාභ වශයෙන් ක්ෂය වීම හඳුනාගනු ලැබේ.

ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය පහත පරිදි වේ;

| | |
|---|---|
| ගොඩනැඟිලි සහ සවිකිරීම් | අවුරුදු 20 |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | අවුරුදු 05 |
| කාර්යාල උපකරණ | අවුරුදු 05 |
| පරිගණක සහ උපාංග | අවුරුදු 04 |
| මෝටර් වාහන | අවුරුදු 04 |

දේපළ, පිරියත සහ උපකරණ යන අයිතමයන්හි එක් එක් විශේෂ කොටස සඳහා ක්ෂය වීමේ අනුපාතය ඒවා භාවිතය සඳහා පවතින කාලයේ දී තීරණය කරනු ලැබේ. එනම් කළමනාකාරීත්වය විසින් අපේක්ෂා කරනු ලබන ආකාරයේ ක්‍රියාකාරී තත්ත්වයෙන් අදාළ ස්ථානයේ තිබීම. ක්ෂය වීමේ ක්‍රමවේදයන්, ඵලදායී ජීව කාලයන් සහ අවශේෂ අගයන් සෑම වාර්තා කරන දිනටම සමාලෝචනය කර යෝග්‍ය පරිදි ගැළපීම් කරනු ලැබේ.

## 3.2 ආයෝජන දේපළ

### 3.2.1 හඳුනාගැනීමේ පදනම හා මිනුම්කරණය

කුලී ආදායම ඉපැයීම හෝ ප්‍රාග්ධන අගය වැඩිවීම හෝ මෙම කරුණු ද්විත්වය වෙනුවෙන්ම දරා සිටින, එනමුත් සාමාන්‍ය ව්‍යාපාර කටයුතු තුළ දී විකිණීම සඳහා නොපවතින දේපළ ආයෝජන දේපළ වේ. මෙම දේපළ භාණ්ඩ හා සේවා නිපදවීම හෝ සැපයුම සඳහා හෝ පරිපාලන කාර්යයන් වෙනුවෙන් භාවිතා කෙරේ.

ආයෝජන දේපළ මුල් අවස්ථාවේ දී එහි පිරිවැයට මිනුම්කරණය කෙරේ. මුල් හඳුනාගැනීමෙන් අනතුරුව, ආයෝජන දේපළ එහි පිරිවැය මත සඳහන් කෙරේ.

### 3.2.2 හඳුනාගැනීම් බැහැර කිරීම

ආයෝජන දේපළ බැහැර කිරීම හෝ ආයෝජන දේපළ ස්ථිරවම භාවිතයෙන් ඉවත් කිරීම සහ එසේ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන විට ආයෝජන දේපළ හඳුනා ගැනීම් බැහැර කරනු ලැබේ. ආයෝජන දේපළක් විශ්‍රාම ගැන්වීම් හෝ ඉවත් කිරීම හේතුවෙන් ඇතිවන යම් ලාභයක් හෝ පාඩුවක් එකී විශ්‍රාම ගැන්වීම හෝ ආයෝජන දේපළක් ඉවත් කිරීම සිදුකළ වර්ෂයේම ලාභ අලාභ ප්‍රකාශයේ හඳුනාගැනේ.

### 3.2.3 ආයෝජන දේපළකට/ආයෝජන දේපළකින් පසුකාලීනව සිදුකරන මාරු කිරීම්

හිමිකරුගේ පදිංචිය අවසන් කිරීම, වෙනත් පාර්ශවයක් වෙත ක්‍රියාත්මක බද්දක් ආරම්භ වීම හෝ ඉදිකිරීමක් හෝ සංවර්ධනය කිරීමක් නිම වීම වැනි සාක්ෂි මඟින් භාවිතයෙහි වෙනස් වීමක් සිදුවුවහොත් පමණක් ආයෝජන දේපළකට මාරු කිරීම් සිදුකරනු ලැබේ.

හිමිකරුගේ පදිංචිය ආරම්භ කිරීම හෝ අලෙවි කිරීමේ පරමාර්ථයෙන් සංවර්ධනය කිරීම් ආරම්භ කිරීම වැනි සාක්ෂි මඟින් භාවිතයෙහි වෙනස් වීමක් සිදුවුවහොත් පමණක් ආයෝජන දේපළකින් මාරු කිරීම් සිදුකරනු ලැබේ.

ආයෝජන දේපළකින් හිමිකරු පදිංචිගත දේපළකට හෝ තොගයකට මාරු කිරීමේ දී, පසුකාලීන ගිණුම්කරණ කාර්යයන් සඳහා සැලකිය යුතු එහි දේපළ පිරිවැය වනුයේ භාවිතයෙහි වෙනස් වීමක් සිදු වූ දිනයේ එහි සාධාරණ අගය වේ. හිමිකරු විසින් පදිංචිගත දේපළක් ආකාරයෙන් දේපළ සමාගම විසින් පරිහරණය කරන්නේ නම් එය ආයෝජන දේපළක් වන අතර, එහි භාවිතයේ වෙනසක් සිදුවන දිනය දක්වාම දේපළ, පිරියත හා උපකරණ යටතේ දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව එකී දේපළ සඳහා සමාගම වගකිව යුතු වේ.

තොගයක් ආයෝජන දේපළක් බවට මාරු කිරීමේ දී, දේපළෙහි සාධාරණ අගය අනුව අදාළ දිනයේ හා එහි පූර්ව ධාරණ අගයේ පවතින වෙනස ලාභ හෝ අලාභ ප්‍රකාශයේ දී හඳුනාගනු ලැබේ. සමාගම විසින් ඉදි කරන ලද ආයෝජන දේපළක, ඉදි කිරීම හෝ සංවර්ධනය කිරීම සමාගම විසින් නිමකරනු ලබන විට දී, දේපළෙහි සාධාරණ අගය අනුව අදාළ දිනයේ හා එහි පූර්ව ධාරණ අගයේ පවතින වෙනස ලාභ හෝ අලාභ ප්‍රකාශයේ දී හඳුනාගනු ලැබේ.

### 3.2.4 මූල්‍ය නොවන වත්කම්හි හානිකරණය

වත්කමක් හානිකරණය පිළිබඳ හැඟවීමක් ඇති ද යන්න සෑම වාර්තාකරණ දිනයකදී ම මහපොළ භාර අරමුදල විසින් තක්සේරු කරයි. කිසියම් හැඟවීමක් ඇත්නම්, හෝ වත්කමක් වෙනුවෙන් වාර්ෂික හානිකරණ පරීක්ෂාව අවශ්‍ය වන්නේ නම්, අරමුදල විසින් වත්කමෙහි නැවත අයකර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක හෝ මුදල් ජනන ඒකකයක (CGU) විකුණුම් පිරිවැය අඩුකළ සාධාරණ අගය සහ එහි භාවිත අගය යන දෙකෙන් වඩාත් වැඩි අගය වත්කමක නැවත අයකර ගත හැකි වටිනාකම වේ. වත්කමක් විසින් මුදල් ප්‍රවාහ ජනනය නොකරන අවස්ථාවන්හිදී මෙය තනි වත්කමක් සඳහා නිර්ණය කරන අතර අනෙකුත් වත්කම් හෝ වත්කම් කාණ්ඩ වලින් බොහෝ දුරට ස්වාධීන වේ. වත්කමක හෝ මුදල් ජනන ඒකකයක ධාරණ අගය එහි නැවත අයකර ගත හැකි වටිනාකම ඉක්මවන අවස්ථාවක, වත්කම් හානිකරණ වූ ලෙස සැලකෙන අතර එකී වත්කම එහි නැවත අයකරගත හැකි අගයට සටහන් කරනු ලැබේ. භාවිත අගය තක්සේරු කිරීමේ දී මුදලේ කාල අගය සහ වත්කමට සුවිශේෂී වූ අවදානම් වල ප්‍රවර්තන වෙළඳ පොළ තක්සේරු පිළිබිඹු කරන බදුවලට පෙර වට්ටම් අනුපාතිකයක් භාවිතා කරමින් ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහ ඒවායේ වර්තමාන අගයට වට්ටම් කරනු ලැබේ. විකුණුම් පිරිවැය අඩුකළ සාධාරණ අගය නිර්ණය කිරීමේ දී, ආසන්නතම වෙළඳ පොළ ගනුදෙනු තිබේ නම් ඒවා සැලකිල්ලට ගනු ලැබේ. එවැනි ගනුදෙනු හඳුනාගැනීමට නොහැකි නම්, යෝග්‍ය ආගණන ආකෘතියක් යොදා ගනු ලැබේ.

**3.3 පරිපාලිතයන්හි ආයෝජන හා අනෙකුත් ආයෝජන**

පරිපාලිතයන්හි සිදුකරන අයෝජන හා අනෙකුත් ආයෝජන මුල් අවස්ථාවේ දී සමාගමේ මූල්‍ය ප්‍රකාශන වල දී පිරිවැයක් ලෙස හඳුනා ගැනේ. පරිපාලිතයන් අත්පත් කරගැනීමට අදාළ යම් ගනුදෙනු පිරිවැයක් එම අවස්ථාවේදීම ආදායම් ප්‍රකාශයේ හඳුනාගන්නා අතර, පරිපාලිතයන්හි සිදුකරන අයෝජන මුල් අවස්ථාවේ හඳුනාගැනීමෙන් අනතුරුව සමුච්චිත හානිකරණ පාඩු අඩු කිරීමෙන් පසු පිරිවැය මත දක්වනු ලැබේ.

3.4 **විදේශීය මුදල්**

අ) **ව්‍යවහාරික හා ඉදිරිපත් කෙරෙන මුදල් ඒකකය**

මෙම අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත අයිතමයන් මෙම අස්ථිත්වය ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරයේ මුදල් ඒකකයෙන් (ව්‍යවහාරික මුදල් ඒකකය) මිනුම්ගත කරනු ලැබේ. මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර එය සමාගමේ ව්‍යවහාරික හා ඉදිරිපත් කෙරෙන මුදල් ඒකකයයි.

ආ) **ගනුදෙනු හා ශේෂ**

විදේශ මුදල් ඒකක වලින් සිදුවන ගනුදෙනු, අදාළ ගනුදෙනු සිදුවන දිනයන්හි දී බල පැවැත්වෙන විනිමය අනුපාතිකයන් භාවිතයෙන් ව්‍යවහාරික මුදල් ඒකකය වෙත පරිවර්තය කරනු ලැබේ. එවැනි ගනුදෙනු පියවීමේ දී සහ විදේශ ව්‍යාවහාර මුදල් ඒකක වලින් සිදුකරන මුදල් වත්කම් හා බැරකම් ගනුදෙනුවල දී ප්‍රතිඵල වන විදේශ විනිමය ලාභ සහ පාඩු විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ. මුදල් වත්කම් හා බැරකම් ශේෂ වසර අවසාන විනිමය අනුපාතිකය අනුව පරිවර්තනය කරනු ලැබේ.

**3.5.1 බදුකරණය**

**3.5.1 ප්‍රවර්තන බදුකරණය**

ප්‍රවර්තන හා පූර්ව කාල පරිච්ඡේද සඳහා ප්‍රවර්තන ආදායම් බදු වත්කම් හා වගකීම් ගණනය කරනු ලබන්නේ ආදායම් බදු කොමසාරිස්වරයා වෙතින් ලැබිය යුතු හෝ එම දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු මුදල් ප්‍රමාණය වශයෙනි. මෙම ප්‍රමාණයන් ගණනය සඳහා යොදා ගැනෙනුයේ වාර්තාකරණ දිනයට පෙර සිට බලපැවැත් වූ හෝ එම දිනයට බල පැවැත්වෙන පරිදි පනවා ඇති බදු අනුපාතික හා බදු නීති වේ.

මෙම භාර අරමුදල සඳහා ආදායම් බදු ප්‍රතිපාදන පදනම පහත පරිදි වේ.

අ) **මහපොළ භාර අරමුදල**

1981 අංක 66 දරණ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල් පනත අනුව මහපොළ භාර අරමුදල ආදායම් බදු වලින් නිදහස් කර ඇත.

**3.5. 2 විලම්බිත බදු**

වාර්තාකරණ දිනට වත්කම් හා බැරකම්වල බදු පදනම් හා මූල්‍ය වාර්තාකරණ කාර්යයන් වෙනුවෙන් ඒවායේ ධාරණ අගයන් අතර තාවකාලික වෙනස මත බැරකම් ක්‍රමය භාවිතා කරමින් විලම්බිත බදු ප්‍රතිපාදනය කෙරේ.

බදු අයකළ හැකි සියලු තාවකාලික වෙනස්කම් වෙනුවෙන් විලම්බිත බදු බැරකම් හඳුනාගනු ලැබේ.

සියලු අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් වෙනුවෙන් විලම්බිත බදු වත්කම් හඳුනාගනු ලබන අතර, භාවිතා නොකළ බදු ණය හා බදු අලාභ වල අඩු කළ හැකි තාවකාලික වෙනස සහ ඉදිරියට ගෙන යැම උපයෝජනය කිරීම සඳහා යොදා ගැනීමට බදු අය කළ හැකි ලාභ පැවතීමේ සම්භාවිතාව පවතින තෙක් දුරට භාවිතා නොකළ බදු ණය හා බදු අලාභ ඉදිරියට ගෙන යැමේ හැකියාව ඇත.

### 3.6 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් සමාන දෑ ලෙස ඇතුළත් වනුයේ අතැති හා බැංකුවේ ඇති මුදල්, අත්පත් කරගන්නා දිනයේ සිට මාස තුනක් හෝ ඊට අඩු කාල සීමාවක් තුළ මුල් කල් පිරීමේ දිනය සහිත ඉහළ ද්‍රවශීලතාවයකින් යුතු අනෙකුත් කෙටි කාලීන ආයෝජන වේ. බැංකු අයිරා පහසුකම් ශේෂ පත්‍රයේ ජංගම වගකීම් යටතේ දැක්වේ.

## 4 මූල්‍ය උපකරණ - මුල් වරට හඳුනා ගැනීම හා පසුව සිදුවන මිනුම්කරණයන්

### 4.1 මූල්‍ය වත්කම්

#### 4.1.1 මූල්‍ය වත්කම් වර්ගීකරණය හා මිනුම්කරණය

2018 ජනවාරි මස 01 වන දින සිට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 (SLFRS 9) අනුව, වත්කම් කළමනාකරණය සඳහා වූ ව්‍යාපාරික අකෘතිය මත පදනම්ව මහපොළ භාර අරමුදල විසින් එහි සියලු මූල්‍ය වත්කම් වර්ගීකරණය පහත සඳහන් ආකාර වලින් එකකට සිදුකරනු ලැබේ.;

- ක්‍රමක්ෂය පිරිවැය
- වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය (FVOCI)
- ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය (FVTPL)

මූල්‍ය වත්කම්වල පසුව සිදුවන මිනුම්කරණයන් ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී.

#### 4.1.2 ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්කරණය කරන ලද මූල්‍ය වත්කම්

මූල්‍ය වත්කමක් පහත දැක්වෙන කොන්දේසි ද්විත්වයම සපුරාලන්නේ නම් හා ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය (FVTPL) මත නම් නොකරන්නේ නම්, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 (SLFRS 9) අනුව එම මූල්‍ය වත්කම ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්කරණය කෙරේ:

- මූල්‍ය වත්කම රඳවා ගැනීම මඟින් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කිරීම අරමුණු කරගත් ව්‍යාපාර ආකෘතියක් තුළ වත්කම දරා සිටින විට; සහ

- හුදෙක් ප්‍රාග්ධනය වෙනුවෙන් හා හිඟ ප්‍රාග්ධනය මත පොළී ගෙවීම ආකාරයේ මුදල් ප්‍රවාහයන් යම් නිශ්චිත දිනයක දී පැන නඟින මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත කොන්දේසි.

**4.1.3 වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට (FVOCI) මිනුම්කරණය කරන ලද මූල්‍ය වත්කම්**

වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මිනුම්කරණය කරන ලද මූල්‍ය වත්කම් ලෙස වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මිනුම්කරණය කරන ලද ණය හා ස්කන්ධ උපකරණ ඇතුළත් වේ.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 (SLFRS 9) අනුව, වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මිනුම්කරණය කරන ලද ණය උපකරණ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට නම් කරන ලද ස්කන්ධ උපකරණ වලින් මෙය සමන්විත වේ.

**4.1.4 වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය (FVOCI) අනුව ණය උපකරණ**

ණය උපකරණයක් පහත දැක්වෙන කොන්දේසි ද්විත්වයම සපුරාලන්නේ නම් හා ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය (FVTPL) මත නම් නොකරන්නේ නම්, එම ණය උපකරණය වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය (FVOCI) අනුව මිනුම්කරණය කෙරේ:

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කිරීම හා මූල්‍ය වත්කම් විකිණීම මඟින් සිය අරමුණු ඉටු කර ගනු ලබන ව්‍යාපාර ආකෘතියක් තුළ වත්කම දරා සිටින විට; සහ

- හුදෙක් ප්‍රාග්ධනය වෙනුවෙන් හා හිඟ ප්‍රාග්ධනය මත පොළී ගෙවීම ආකාරයේ මුදල් ප්‍රවාහයන් යම් නිශ්චිත දිනයක දී පැන නඟින මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත කොන්දේසි.

වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය අනුව පවතින ණය උපකරණ, වෙනත් විස්තීර්ණ ආදායම්හි හඳුනාගනු ලබන සාධාරණ අගය වෙනස් වීමෙන් පැන නඟින ලාභ හෝ අලාභ සමඟින් පසුව සාධාරණ අගය අනුව මිනුම්කරණය කෙරේ. පොලී ආදායම සහ අපේක්ෂිත බැරකම් අලාභ සහ ප්‍රතිවර්තනයන් ලාභ අලාභ තුළ හඳුනාගැනේ. පෙර වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනාගනු ලැබූ සමුච්චිත ලාභ හෝ අලාභ හඳුනාගැනීම් බැහැර කිරීමේ දී, වෙනත් විස්තීර්ණ ආදායම් වලින් ලාභ අලාභ වෙත ප්‍රතිවර්ගීකරණය කෙරේ. මීට පෙර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 (LKAS 39) යටතේ විකිණීම සඳහා පවතින වශයෙන් වර්ගීකරණය කර තිබූ රජයේ සුරැකුම්පත්වලින් මෙම උපකරණ සමන්විත වේ.

**4.1.5 වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය අනුව ස්කන්ධ උපකරණ**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 32 (LKAS 32)හි "මූල්‍ය සාධනපත්‍ර: ඉදිරිපත් කිරීම" යටතේ ස්කන්ධය යන්නෙහි අර්ථ දැක්වීමට අනුකූල වන සහ වෙළඳාම සඳහා රඳවා නොගත් ස්කන්ධ උපකරණවලින් ක්‍රමෝපායික කාර්යය සඳහා රඳවාගත් ස්කන්ධ ආයෝජන වලින් කොටසක් මුල් හඳුනාගැනීමෙන් පසු, වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය (FVOCI) අනුව ණය උපකරණ ලෙස අවලංගු කර ගත නොහැකි පරිදි වර්ගීකරණය කිරීමට සමාගම විසින් ඇතැම්විට තීරණය කරනු ලැබේ. එවැනි වර්ගීකරණයක් උපකරණයෙන් උපකරණයට යන පදනම මත නිගමනය වේ.

.මෙම ස්කන්ධ උපකරණවල ලාභ සහ අලාභ කිසිදුවිටක ලාභ හො අලාභ යටතට ප්‍රතිචක්‍රණය නොවන අතර, ඒ වෙනුවට එකී හඳුනාගැනීම් බැහැර කරන අවස්ථාවේ දී රඳවාගත් ඉපැයුම් වෙත ඍජුවම මාරු කෙරේ. ගෙවීම් වෙත අයිතිය ස්ථාපනය වූ පසු, ලාභාංශ ලාභ හෝ අලාභ ලෙස අනෙකුත් මෙහෙයුම් ආදායම් යටතේ හඳුනාගැනේ. වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය අනුව වන ණය උපකරණ හානිකරණ පරීක්ෂාවට භාජනය නොවේ.
මීට පෙර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 (LKAS 39)හි "විකිණීම සඳහා පවතින" යටතේ වර්ගීකරණය වූ මිල සඳහන් නොකළ හිමිකම් කොටස් වලින් මෙම උපකරණ සමන්විත වේ.

### 4.1.6 ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කරන ලද මූල්‍ය වත්කම්

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 (SLFRS 9) අනුව, ක්‍රමක්ෂය පිරිවැය හෝ වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය අනුව වර්ගීකරණය වූ මූල්‍ය වත්කම් හැර අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ. වෙළඳාම සඳහා රඳවා ගත් හෝ කළමනාකරණය කරන හා ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කිරීම සඳහා දරා නොසිටින මෙන්ම මුදල් ප්‍රවාහ එක්රැස් කිරීම සඳහා සහ මූල්‍ය වත්කම් විකිණීම යන කාර්ය ද්විත්වය වෙනුවෙන්ම දරා නොසිටින බැවින් එහි කාර්යසාධනය සාධාරණ අගය මත පදනම්ව ඇගයීම සිදුවන මූල්‍ය වත්කම් ද සහ මුල් හඳුනාගැනීමෙන් පසු ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව නම් කරන ලද මූල්‍ය වත්කම් ද ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මූල්‍ය වත්කම් යටතට ඇතුළත් වේ.

ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මූල්‍ය වත්කම් යටතට ඇතුළත් වනුයේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 (LKAS 39) අනුව, වෙළඳාම සඳහා රඳවා ගත් මූල්‍ය වත්කම් හා ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව නම් කරන ලද මූල්‍ය වත්කම් ය.

## 4.2 මූල්‍ය බැරකම්

### 4.2.1 මූල්‍ය බැරකම් වර්ගීකරණය හා පසුකාලීන මිනුම්කරණය

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 (SLFRS 9) අනුව, මූල්‍ය බැරකම් පහත ආකාරයෙන් වර්ගීකරණය කෙරේ.

- ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මූල්‍ය බැරකම්, සහ
  - වෙළඳාම සඳහා රඳවා ගත් හෝ
  - ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට නම් කරන ලද
    වශයෙන් මෙම කාණ්ඩය තුළ වර්ගීකරණය වේ.
- ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්කරණය කළ මූල්‍ය බැරකම්

මූල්‍ය බැරකම්වල පසුකාලීන මිනුම්කරණය ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 (SLFRS 9) මගින් මූල්‍ය බැරකම් වර්ගීකරණය සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 (LKAS 39) හි පවතින අවශ්‍යතා බොහෝ සෙයින් රඳවා ගෙන ඇත.

### 4.2.2 ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මූල්‍ය බැරකම්

වෙළඳාම සඳහා රඳවා ගත් මූල්‍ය බැරකම් සහ ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මුල් හඳුනාගැනීමෙන් අනතුරුව නම් කරන ලද මූල්‍ය වගකීම් ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මූල්‍ය බැරකම් යටතට ඇතුළත් වේ. ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව නම් නොකෙරන මූල්‍ය බැරකම් ක්‍රමක්ෂය පිරිවැය අනුව මූල්‍ය බැරකම් ලෙස වර්ගීකරණය කෙරේ.

## 4.3 මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් හඳුනාගැනීම බැහැර කිරීම

### 4. 3.1 මූල්‍ය වත්කම්

මූල්‍ය වත්කමකින් ජනනය වන මුදල් ප්‍රවාහයන් සඳහා ඇති ගිවිසුම්ගත අයිතිය අවසන් වෙන විට හෝ ගනුදෙනුවකින් මුදල් ප්‍රවාහයක් ලැබීමට ඇති අයිතිය පැවරීමේ දී මූල්‍ය වත්කමෙහි අයිතිය හා සම්බන්ධිත සැලකිය යුතු සියලු අවදානම් හා ප්‍රතිලාභ සමාගම විසින් පවරා ඇති විට හෝ නැතහොත් මූල්‍ය වත්කමෙහි අයිතිය හා සම්බන්ධිත සැලකිය යුතු සියලු අවදානම් හා ප්‍රතිලාභ සමාගම විසින් පැවරීම හෝ රඳවා ගනීම සිදු නොකරන විට සහ සමාගම විසින් මූල්‍ය වත්කමක පාලනය රඳවා ගැනීම සිදුනොකරන විට යන අවස්ථාවල දී සමාගම විසින් එම මූල්‍ය වත්කමෙහි (හෝ අදාළ වන පරිදි එහි කොටසක හෝ) හඳුනාගැනීම බැහැර කරනු ඇත.

වත්කමෙහි ධාරණ අගය (හෝ වත්කමෙහි හඳුනාගැනීම බැහැර කරන කොටසට අදාළ වන ධාරණ අගය) හා ලැබී ඇති ප්‍රතිශ්ඨාවල එකතුව (අලුතින් එක් කරගත් නව වත්කම්වලින් අලුතින් භාර ගන්නා බැරකම් අඩුකර එයද ඇතුළුව) අතර වෙනස සහ වෙනත් විස්තීර්ණ ආදායම්හි දී හඳුනාගන්නා යම් සමුච්චිත ලාභ/අලාභ, මූල්‍ය වත්කමක හඳුනාගැනීම බැහැර කිරීමේ දී ලාභ හෝ අලාභ වල දී හඳුනා ගැනේ.

එසේ වුව ද, වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය අනුව නම් කරන ස්කන්ධ ආයෝජන සුරැකුම් වලට අදාළව වෙනත් විස්තීර්ණ ආදායම්හි දී හඳුනාගන්නා සමුච්චිත ලාභ/අලාභ, එවැනි සුරැකුම්වල හඳුනාගැනීම බැහැර කිරීමේ දී ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 (SLFRS 9) ට අනුකූලව ලාභ හෝ අලාභ වල දී හඳුනා නො ගැනේ.

සමාගම විසින් නිර්මාණය කරනු ලබන හෝ රඳවා ගෙන සිටින, හඳුනාගැනීම බැහැර කිරීම සඳහා සුදුසුකම් ලබන පැවරූ මූල්‍ය වත්කමකට අදාළ කවර හෝ හිමිකමක් ඇතොත් එය වෙනම වත්කමක් හෝ බැරකමක් වශයෙන් හඳුනා ගැනේ.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනාගනු ලබන වත්කම් මාරු කිරීම සඳහා සමාගම ගනුදෙනු වලට එළඹීම සිදු කරන මුත් මාරු කරනු ලබන වත්කම්හි හෝ එහි කොටසක සියලු හෝ සැලකිය යුතු සියලු අවදානම් හා ප්‍රතිලාභ රඳවා ගැනීම සිදු කරයි. එවැනි අවස්ථාවන්හි දී, මාරු කරනු ලබන වත්කම්වල හඳුනාගැනීම බැහැර කිරීම සිදු කරනු නොලැබේ.

වත්කම් තෙවන පාර්ශවයක් වෙත, මාරු කරනු ලබන වත්කම්හි සමකාලීන මුළු ඉපැයුම් අනුපාතිකය හුවමාරු වන පරිදි විකිණීම සිදු කරන විට දී, එය අලෙවි හා ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනුවක් හා සමානව සුරැකුම් කරන ලද මූල්‍යමය ගනුදෙනුවක් ලෙස ගිණුම්ගත කෙරේ. මීට හේතුව සමාගම විසින් එකී වත්කම් වල හිමිකාරිත්වයේ සියලුම හෝ සැලකිය යුතු සියලු අවදානම් හා ප්‍රතිලාභ රඳවා ගැනීමයි.

සමාගම විසින් වත්කමකින් මුදල් ප්‍රවාහයක් ලැබීමට ඇති සිය අයිතිය පැවරූ විට හෝ පැවරීමේ විධිවිධානයකට එළඹී සිටීම සහ වත්කමක සැලකිය යුතු සියලු අවදානම් හා ප්‍රතිලාභ පැවරීමක් හෝ රඳවා ගැනීමක් හෝ සිදුකර නොමැති හෝ වත්කම පාලනය කිරීම පවරා නොමැති විටක, වත්කම සම්බන්ධයෙන් සමාගමේ අඛණ්ඩ සම්බන්ධතාවය පවතින සීමාව දක්වා එම වත්කම හඳුනාගැනීම සිදු කෙරේ. එම අවස්ථාවේ දී සමාගම විසින් ආශ්‍රිත බැරකම් හඳුනාගනු ලැබේ. සමාගම විසින් රඳවාගනු ලබන අයිතීන් හා බැඳීම් පිළිබිඹු වීමේ පදනම මත පැවරූ වත්කම් හා ආශ්‍රිත වගකීම් මිනුම්කරණය කෙරේ.

**4.3.2 මූල්‍ය බැරකම්**

මූල්‍ය බැරකමක ගිවිසුම්ගත බැඳීම් ඉටු කළ විට හෝ අවලංගු වූ විට අදාළ කාලය අවසන් වූ විට, සමාගම විසින් මූල්‍ය බැරකම හඳුනාගැනීම බැහැර කරනු ලැබේ.

**4.3.3 මූල්‍ය උපකරණ හිලව් කිරීම**

මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් හිලව්කර එකී ශුද්ධ වටිනාකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වාර්තා කරන්නේ හඳුනාගත් වටිනාකම් හිලව් කිරීම ප්‍රවර්තන ලෙස බල ගැන්විය හැකි නීතිමය අයිතියක් ඇත්තේ නම් පමණක්ම වන අතර, ශුද්ධ පදනමක් මත පියවීමට නැතහොත් උපලබ්ධි කර ගැනීමට හා සමගාමීව බැරකම් අවසන් කිරීමට අභිප්‍රායක් ඇත්තේ නම් පමණකි.

ආදායම් සහ වියදම් ශුද්ධ පදනම මත ඉදිරිපත් කරනුයේ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත මඟින් අවසර ලැබෙන අවස්ථාවන්හි දී පමණක්, හෝ සමාගමේ වෙළඳ කටයුතු වැනි සමාන ආකාරයේ ගනුදෙනු සමූහයකින් ප්‍රතිඵල වන ලාභ හා අලාභ සඳහා පමණි.

**5. බැරකම් හා ප්‍රතිපාදන**

**5.1 බැරකම්**

**5.1.1 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්**

**5.1.2 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - විශ්‍රාම පාරිතෝෂිකය**

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සියලුම සේවකයන් සඳහා පළමු වසරේ සිටම ක්‍රියාත්මක වන විශ්‍රාම පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන වෙන්කරනු ලැබේ. එසේ වුව ද, 1983 අංක 12 දරන පාරිතෝෂිත ගෙවීම් පනත යටතේ, සේවකයකු සඳහා වගකීමක් ඇති වනුයේ වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ වීමෙන් අනතුරුව වේ. මෙම වගකීම ගණනය කරනුයේ සෑම වර්ෂයක් සඳහා ම මාසයක වැටුපෙන් අර්ධයක අනුපාතිකය මත වේ. මෙම අයිතමය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සේවක ප්‍රතිලාභ බැරකම් යටතේ දැක්වේ.

මෙම පාරිතෝෂිත බැරකම් වෙනුවෙන් බාහිර ලෙස මුදල් යෙදවීමක් සිදු නොවේ.

**5.1.3 නිශ්චිත දායකත්ව සැලසුම්- සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල**

මහපොළ භාර අරමුදල විසින් සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල වෙත දරණ දායකත්වයන් අදාළ නීතිරීති වලට අනුකූලව අදාළ දායකත්ව ප්‍රතිපාදන මඟින් ආවරණය වේ. සේවකයන් ආවරණය කරමින් දායකත්ව සැලසුම් වෙත දායක මුදල් ගෙවීමට ඇති බැඳීම් ආදායම් ප්‍රකාශනයේ වියදමක් වශයෙන් හඳුනාගනු ලැබේ.

**සේවක අර්ථසාධක අරමුදල**

භාරකාර අරමුදල හා සේවකයා විසින් පිළිවෙලින් සේවකයාගේ මාසික දළ වැටුපෙන් 15%ක් හා 10%ක් වශයෙන් සේවක අර්ථසාධක අරමුදලට දායකත්වය සපයනු ලැබේ.

**සේවක භාරකාර අරමුදල**

සේවක භාරකාර අරමුදලට සේවකයාගේ මාසික දළ වැටුපෙන් 3%ක දායකත්වයක් මහපොළ භාරකාර අරමුදල විසින් දරණු ලැබේ.

## 5.2 ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් බැංකුවට වර්තමාන බැදීමක් (නෛතික හෝ සම්මුතික) පවතින විට, එම බැදීම් බේරුම් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ගැබ් වූ සම්පත් බැහැරට ගලා යෑමේ ඉඩකඩ පවතින විට, හා බැදීම් ප්‍රමාණය පිළිබඳ විශ්වාසනීය ඇස්තමේන්තුවක් කළ හැකිවිට ප්‍රතිපාදන හඳුනාගැනේ. සමාගම විසින් ඇතැම් හෝ සියලු ප්‍රතිපාදන ප්‍රතිපූරණය කිරීමක් අපේක්ෂා කරන අවස්ථාවක දී, නිදසුනක් වශයෙන් රක්ෂණ කොන්ත්‍රාත්තුවක් යටතේ නම්, ප්‍රතිපූරණය වෙනම වත්කමක් යටතේ හඳුනාගන්නා අතර නමුත් එසේ කරනුයේ ප්‍රතිපූරණය සත්‍ය වශයෙන්ම ස්ථිර නම් පමණකි. කවර ආකාරයක හෝ ප්‍රතිපාදනයක් හා සබැඳි වියදම්, යම් ප්‍රතිපූරණයක් තිබේ නම් එය අඩු කොට ආදායම් ප්‍රකාශය තුළ ඉදිරිපත් කෙරේ.

මුදලේ කාල අගයේ බලපෑම ප්‍රමාණාත්මක නම්, බැරකම් සඳහා නිශ්චිත වන අවදානම් අදාළ පරිදි පෙන්නුම් කෙරෙන ප්‍රවර්තන පෙර-බදු අනුපාතිකය භාවිතයෙන් ප්‍රතිපාදන වට්ටම් කරනු ලැබේ. වට්ටම් කිරීම යොදා ගනු ලබන විට කාලය ගත වීමට අනුව සිදුවන ප්‍රතිපාන වැඩිවීම මූල්‍ය පිරිවැයක් වශයෙන් හඳුනාගැනේ.

# 6. ආදායම් හා වියදම්

## 6.1 ආදායම් හඳුනාගැනීම

2018 ජනවාරි මස 01 වන දින සිට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 15 (SLFRS 15) මගින්, ආදායම සම්බන්ධ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18 (LKAS 18) හා ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සම්බන්ධ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 11 (LKAS 11) සහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ විවරණ කමිටුවේ පාරිභෝගික ලැදියාව සම්බන්ධ IFRIC 13 ද ඇතුළුව ආදායම් හඳුනාගැනීම් මාර්ගෝපදේශ ප්‍රතිස්ථාපනය කර ඇත.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 15 (SLFRS 15) මගින් ආදායම හඳුනාගනු ලබන්නේ කෙසේ ද හා කොපමණ වශයෙන් කවර දිනකට ද යන්න නිර්ණය කිරීම සඳහා සම්පූර්ණ ආකෘති රාමුවක් සපයනු ලැබේ. ආදායම හඳුනාගනු ලබන්නේ කවර දිනයකට ද හා කවර අගයකින් ද නිර්ණය කිරීම සඳහා අස්තිත්ව විසින් පියවර පහකින් යුතු ආකෘතියක් යොදා ගැනීම අවශ්‍ය වේ. ආදායම හඳුනා ගන්නේ කවර දිනයක ද හෝ අස්තිත්වය සඳහා අපේක්ෂා කරන හිමිකාරීත්වය යටතේ කුමන අගයකින් පාරිභෝගිකයා වෙත භාණ්ඩ හා සේවාවල පාලනය පවරා දීම යන්න සහ භාරකාර අරමුදල වෙත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම අපේක්ෂා කළ හැක්කේ කවර දිනයක දී යන්න හා ගෙවීම් කරන දිනය කුමක් වුවද ආදායම හා දරණ ලද හෝ දැරිය යුතු ආශ්‍රිත වියදම් විශ්වාසනීය ආකාරයකින් මිනුම්කරණය මෙම ආකෘතිය මගින් නිශ්චය කෙරේ. ගිවිසුම්ගත නිශ්චිත ගෙවීම් කොන්දේසි ද සැලකිල්ලට ගෙන ලැබී ඇති හා ලැබිය යුතු ප්‍රතිශ්‍යාවන්ට අදාළ සාධාරණ අගය මත ආදායම් මිනුම්කරණය වේ.

### 6.1.1 පොලී ආදායම්

ක්‍රමක්ෂය කරන ලද පිරිවැය අනුව මිනුම්ගත සියලු මූල්‍ය උපකරණ හා විකිණීම සඳහා පවතින යටතේ වර්ගීකරණය කළ පොළී දරන මූල්‍යමය වත්කම් මත පොළී ආදායම හෝ වියදම් වාර්තා කරනුයේ සඵල පොළී අනුපාතිකය (EIR) මත වේ. සඵල පොළී අනුපාතිකය යනු මූල්‍ය වත්කමෙහි හෝ බැරකමෙහි ශුද්ධ ධාරණ අගයට මූල්‍ය උපකරණවල අපේක්ෂිත ජීව කාලය හෝ කෙටි කාල සීමාවක් ඔස්සේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම් අනුව තත්ත්වාකාරයෙන් වට්ටම් කරනු ලැබූ අනුපාතිකයයි. ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය ආදායම් තුළ පොලී ආදායම ඇතුළත් වේ.

### 6.1.2 අනෙකුත් ආදායම්

අනෙකුත් ආදායම් උපචිත පදනම යටතේ හඳුනාගැනේ.

### 6.2 වියදම්

ව්‍යාපාරය පවත්වාගෙන යාමට වැය කෙරෙන සියලු වියදම් වසර සඳහා ලාභය ගණනය කිරීමේ දී ආදායමෙන් අය කරනු ලැබේ. අලුත්වැඩියා කිරීම් හා අලුත් කිරීම් අදාළ වියදම දරනු ලැබූ වර්ෂයට අදාළ ලාභ හා අලාභ වලින් අය කරණු ලැබේ.

| 7 | ආදායම | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|---|
| | ශුද්ධ පොළී ආදායම (NWCL සහ MTF) -සටහන 7.1 | 943,992,948 | 1,097,644,199 |
| | සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් ලද ලාභ කොටස | 904,600,387 | - |
| | SLIIT වෙතින් ලද බදු කුළිය | 20,000,000 | 20,000,000 |
| | | **1,868,593,335** | **1,117,644,199** |

| 7.1 | NWCL මඟින් කළමනාකරණය කරනු ලබන ආයෝජන කළඹ සඳහා ශුද්ධ පොළිය | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|---|
| | **වෙනත් පොළී** | | |
| | NWCL ආයෝජන කළඹ - ආයෝජන ආදායම | 758,219,849 | 913,920,262 |
| | MTF - ආයෝජන ආදායම | 185,773,099 | 183,723,937 |
| | | **943,992,948** | **1,097,644,199** |

**8 සෘජු වියදම්**

| | **ශිෂ්‍යත්ව ප්‍රදාන වියදම්** | **2018<br>Rs.** | **2017<br>Rs.** |
|---|---|---|---|
| | ශිෂ්‍යත්ව ගෙවීම් - විශ්වවිද්‍යාල | 1,269,525,962 | 1,161,627,224 |
| | ශිෂ්‍යත්ව ගෙවීම් - තාක්ෂණික විද්‍යාල | 47,040,200 | 76,028,800 |
| | ශිෂ්‍යත්ව ගෙවීම්- වෙනත් උසස් අධ්‍යාපන ආයතන | 6,693,400 | 17,918,804 |
| | නව ශිෂ්‍යත්ව ප්‍රදාන වියදම් | 2,307,228 | 754,200 |
| | | **1,325,566,790** | **1,256,329,028** |

| 9 | වෙනත් ආදායම් | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|---|
| | කාර්ය මණ්ඩල ණය පොළී | 45,384 | 44,610 |
| | වෙළඳ ප්‍රදර්ශන ආදායම | - | 2,498,399 |
| | ආධාර | 15,000 | 250,000 |
| | අයතරගත් මුදල් | 229,500 | 85,100 |
| | සුළු මුදල් | 5,825 | 20,523 |
| | ස්ථාවර වත්කම් බැහැර කිරීමෙන් ලද ආදායම | 3,457,750 | 8,000 |
| | | **3,753,459** | **2,906,632** |

| 10 පරිපාලන වියදම් | 2018 | 2017 |
|---|---|---|
| | රු. | රු. |
| වැටුප් | 9,233,460 | 6,150,141 |
| පාම්ණිමේ දීමනා | 457,125 | 301,000 |
| අතිකාල සහ නිවාඩු දින දීමනා ගෙවීම් | 466,319 | 250,685 |
| සේවක අර්ථසාධක අරමුදල | 1,911,540 | 643,187 |
| සේව ක භාරකාර අරමුදල | 393,295 | 132,901 |
| නිවාඩු වෙනුවෙන් ගෙවීම් | 243,771 | 451,556 |
| ක්ෂයවීම් | 56,039,045 | 54,751,056 |
| තැපැල් ගාස්තු සහ සන්නිවේදන ගාස්තු | 612,556 | 345,498 |
| පාරිතෝෂික ගෙවීම් | 999,218 | 805,422 |
| ශුභසාධන වියදම් | 191,467 | 58,440 |
| දුරකථන ගාස්තු | 41,694 | 18,520 |
| පුහුණු ගාස්තු | - | 8,500 |
| විගණන සහ කළමනාකරණ කමිටු ගාස්තු | 42,000 | 42,000 |
| භාරකාර මණ්ඩල සාමාජික ගාස්තු | 218,741 | 73,500 |
| ඉන්ධන, ගමන් වියදම් සහ යැපීම් දීමනා | 260,073 | 329,810 |
| ජලය | - | 26,497 |
| විදුලිය | 518,056 | 253,573 |
| පවිත්‍රතා ගාස්තු | 70,566 | 114,750 |
| ආරක්ෂක ගාස්තු | 269,000 | 231,500 |
| මුද්‍රණ ගාස්තු සහ ලිපි ද්‍රව්‍ය | 578,928 | 434,895 |
| නඩත්තු වියදම් | 148,151 | 82,379 |
| ගොඩනැගිලි කුළී | 3,863,862 | 5,261,278 |
| පද්ධති නඩත්තුව සහ තොරතුරු තාක්ෂණ වියදම් | 27,566 | - |
| ආධාර | 74,550 | - |
| රක්ෂණය | 448,072 | 37,656 |
| දැන්වීම් ගාස්තු | 181,844 | - |
| දායකත්ව ගාස්තු | 25,750 | - |
| සුළු වියදම් | 92,519 | 344,310 |
| වාහන කල් බදු ගාස්තු | 1,828,500 | 507,917 |
| වාහන නඩත්තුව | 34,830 | 231,575 |
| භාණ්ඩාගාර බැඳුම්කර වාරික සහ වට්ටම් | 13,846,907 | |
| WHT -ස්ථිර තැම්පතු | - | 3,097,967 |
| වෘත්තීය ගාස්තු | 2,064,503 | 63,050 |
| බැංකු ගාස්තු | 35,485 | 28,747 |
| | **95,219,392** | **75,078,310** |

**11 පාසල් සංවර්ධන වියදම්**

| | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|
| රාජකීය විද්‍යාලය, පොළොන්නරුව | - | 6,708,524 |
| ශාන්ත ආනා විද්‍යාලය (ක්‍රීඩා මණ්ඩපය) | - | 6,573,000 |
| ලලිත් ඇතුලත්මුදලි අනුස්මරණ උත්සව වියදම් | - | 580,288 |
| අලුත්වැඩියා කිරීමේ වියදම් | - | 2,821,573 |
| | **-** | **16,683,385** |

**12 දේපළ , පිරියත සහ උපකරණ**

| | 2018.01.01 දිනට ශේෂය | එකතුකිරීම් | බැහැරකිරීම් | 2018.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| **12.1 දළ ධාරණ වටිනාකම** | | | | |
| | රු. | රු | රු | රු |
| පිරිවැය | | | | |
| ගොඩනැගිලි | 1,064,520,695 | - | - | 1,064,520,695 |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 7,883,699 | 51,654 | - | 7,935,353 |
| කාර්යාල උපකරණ | 1,479,585 | - | - | 1,479,585 |
| පරිගණක සහ උපාංග | 4,918,839 | 1,950,991 | - | 6,869,830 |
| මෝටර් රථ | 5,100,000 | - | 5,100,000 | - |
| ක්ෂය වූ වත්කම්වල මුළු අගය | **1,083,902,818** | **2,002,645** | **5,100,000** | **1,080,805,463** |

| | 2018.01.01 දිනට ශේෂය | වර්ෂය සඳහා අයකිරීම් | බැහැරකිරීම් | 2018.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| **12.2 ක්ෂය වීම** | | | | |
| | රු. | රු. | රු. | රු. |
| පිරිවැය සහ එකතුකිරීම් | | | | |
| ගොඩනැගිලි | 106,452,070 | 53,226,035 | - | 159,678,105 |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 1,664,274 | 1,425,428 | - | 3,089,702 |
| කාර්යාල උපකරණ | 280,267 | 277,342 | - | 557,609 |
| පරිගණක සහ උපාංග | 2,480,869 | 1,110,240 | - | 3,591,109 |
| මෝටර් රථ | 5,100,000 | - | 5,100,000 | - |
| මුළු ක්ෂයවීම | **115,977,480** | **56,039,045** | **5,100,000** | **166,916,525** |

| | 2018 | 2017 |
|---|---|---|
| **12.3 ශුද්ධ පොත් අගය** | | |
| | රු. | රු. |
| පිරිවැය | | |
| ගොඩනැගිලි | 904,842,590 | 958,068,625 |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 4,845,651 | 6,219,425 |
| කාර්යාල උපකරණ | 921,976 | 1,199,318 |
| පරිගණක සහ උපාංග | 3,278,721 | 2,437,970 |
| | | - |
| දේපළ,පිරියත සහ උපකරණ සඳහා මුළු ධාරණ අගය | **913,888,938** | **967,925,338** |

| 13 ආයෝජන දේපළ | 2018<br>Rs. | 2017<br>Rs. |
|---|---|---|
| සින්නක්කර ඉඩම (මාලබේ පිහිටි SLIIT ආයතනය වෙත බදු පදනම මත ලබා දෙන ලද | 12,460,179 | 12,460,179 |
| | **12,460,179** | **12,460,179** |

සටහන: මාලබේ පිහිටි මෙම ඉඩම ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයට(SLIIT) දරණ කාලීන බදු පදනම යටතේ ලබාදී ඇත.

| 14 පාලිත සමාගම්වල ආයෝජනය | 2018<br>Rs. | 2017<br>Rs. |
|---|---|---|
| නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම | 985,000,000 | 985,000,000 |
| | **985,000,000** | **985,000,000** |

නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම 100% මහපොළ හිමිකාරීත්වය ඇති සමාගමක් වශයෙන් පිහිටුවා ඇත.

| 15 අනෙකුත් ආයෝජන | 2018<br>Rs. | 2017<br>Rs. |
|---|---|---|
| සංවර්ධන ලොතරැයි මණ්ඩලය | 2,200,000 | 2,200,000 |
| | **2,200,000** | **2,200,000** |

| 16 මූල්‍ය වත්කම් | 2018<br>Rs. | 2017<br>Rs. |
|---|---|---|
| භාණ්ඩාගාර බැඳුම්කර ( NWCL ) | 6,066,033,082 | 3,959,606,109 |
| භාණ්ඩාගාර බැඳුම්කර ( MTF ) | 1,175,944,253 | 1,189,791,160 |
| භාණ්ඩාගාර බිල්පත් ( NWCL ) | 198,387,726 | 565,062,113 |
| ණයකර | 1,284,047,982 | 1,111,305,960 |
| දේපල ඇප තැන්පතු | 448,227,563 | 221,626,055 |
| වෙළඳ හුවමාරු පත්‍ර | - | 621,358,828 |
| ස්ථාවර තැන්පතු ( NWCL ) | 216,490,959 | 1,128,829,462 |
| ස්ථාවර තැන්පතු ( MTF ) | 552,173,542 | 312,000,000 |
| ප්‍රති මිලදී ගැනීම් | 290,111,232 | 737,290,168 |
| කළමනාකරණ ගිණුම | 984,911 | 14,569,535 |
| | **10,232,401,250** | **9,861,439,390** |

**17 අත්තිකාරම් හා පෙර ගෙවීම්**

| | 2018<br>Rs. | 2017<br>Rs. |
|---|---|---|
| සේවක ණය හා අත්තිකාරම් | 1,180,729 | 1,359,629 |
| විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 399,000 | 399,000 |
| රථවාහන රක්ෂණ | - | 34,830 |
| ශිෂ්‍යත්ව වාරික ලැබීම් | - | 4,400 |
| | **1,579,729** | **1,797,859** |

**18 අනෙකුත් වත්කම්**

| | 2018<br>Rs. | 2017<br>Rs. |
|---|---|---|
| ලිපිද්‍රව්‍ය | 291,919 | - |
| බදු කුලී තැන්පතු - ජයවර්ධන කේන්ද්‍රය | 1,647,000 | 1,647,000 |
| ස.තො.ස | 348,810 | 348,810 |
| | **2,287,729** | **1,995,810** |

**19 ලැබිය යුතු ගිණුම්**

| | 2018<br>Rs. | 2017<br>Rs. |
|---|---|---|
| සංවර්ධන ලොතරැයි මණ්ඩලය | 100,700,127 | - |
| ස්ථාවර තැන්පතු පොළී | 10,809,227 | 13,622,886 |
| භාණ්ඩාගාර බැඳුම්කර පොළී | 43,827,663 | 43,827,663 |
| බැංකු කෙටි කාලීන තැන්පතු පොළී | 26,723 | - |
| | **155,363,740** | **57,450,549** |

**20 මුදල් හා මුදල් සමාන වත්කම්**

| | 2018<br>Rs. | 2017<br>Rs. |
|---|---|---|
| ලංකා බැංකු ආයතන ශාඛාව ගිණුම් අංකය 1791 | 1,976,911 | (13,280,364) |
| ලංකා බැංකු ආයෝජන බැංකු ශාඛාව ගිණුම් අංකය - 8330283 | 2,616,323 | - |
| ලංකා බැංකු ගිණුම් අංකය - 4079 | (984,911) | (14,569,535) |
| කෙටිකාලීන තැන්පතු - ලංකා බැංකුව ( Overnight Deposit) | 137,000,000 | 35,000,000 |
| | **140,608,323** | **7,150,101** |

| 21 විශ්‍රාමික ප්‍රතිලාභ සඳහා බැඳීම | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|
| වර්ෂය ආරම්භයේ දී ශේෂය | 2,173,542 | 1,368,120 |
| වර්ෂය සඳහා ප්‍රතිපාදන | 999,218 | 805,422 |
| | 3,172,760 | 2,173,542 |

| 22 උපචිත හා අනෙකුත් ගෙවිය යුතු ගිණුම් | 2018<br>Rs. | 2017<br>Rs. |
|---|---|---|
| සොෆ්ට්ලොජික් ඉන්ෆොමේෂන් සමාගම | 556,200 | - |
| වර්චුවල් හොස්ටින් | 25,347 | - |
| දුරකථන බිල්පත් | 20,761 | - |
| ශිෂ්‍යත්ව ගෙවීම් - විශ්ව විද්‍යාල | 109,966,050 | 14,943,250 |
| ශිෂ්‍යත්ව ගෙවීම් - කාර්මික විද්‍යාල | 27,785,500 | 22,108,000 |
| ශිෂ්‍යත්ව ගෙවීම් - අනෙකුත් ආයතන | 3,535,940 | 8,338,456 |
| අතිකාල දීමනා | 22,632 | 33,962 |
| පැමිණීමේ දීමනා | 174,125 | 26,500 |
| පාසැල් සංවර්ධනය | 1,074,097 | 1,074,097 |
| වැටුප් හා වේතන | 74,250 | 606,980 |
| රඳවා ගැනීම් | 1,547,409 | 1,547,409 |
| රඳවා ගැනීම් - සාන්ත ආනා විද්‍යාලය | 382,417 | 382,417 |
| රඳවා ගැනීම් - සර් ජෝන් කොතලාවල විද්‍යාලය | 243,503 | 243,503 |
| පිහිනුම් තටාක වියදම් - ඇඹිලිපිටිය | 585,449 | 585,449 |
| ආරක්ෂක ගෙවීම් | 39,132 | - |
| වාර්ෂික නිවාඩු | 235,207 | - |
| විදුලි බිල්පත් | 37,395 | - |
| ශ්‍රී ලංකා රඳවා ගැනීම් | - | 152,375 |
| සේවක වියදම් | - | 299,958 |
| සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම් | - | 97,026 |
| රථවාහන කුලී | - | 55,200 |
| | 146,305,414 | 50,494,582 |